දැක්ම

අනෙකුත් මාධ්‍ය සේවා හැකියාවන් සමඟ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මුද්‍රිත මාධ්‍ය ආයතනය ලෙස පැවැතීම.

මෙහෙවර

ප්‍රධානතම පෙර ගමන්කරු බවට පත්වෙමින් රටේ විශ්වාසනීය හා උසස් තත්ත්වයේ මාධ්‍ය නිෂ්පාදන / සේවා සැපයීමේ ප්‍රමුඛයා ලෙස පිළිගැනෙන තත්ත්වයට අප පුරෝගාමී මුද්‍රිත මාධ්‍ය ආයතනය පරිවර්තනය වීම. මෙහෙයුම් විශිෂ්ටත්වය, නිෂ්පාදන අගයන් ඉහළ නැංවීම මගින් සහ පෘථුල ප්‍රවෘත්ති එක්රැස් කිරීම කාර්යක්ෂමව භාවිතා කරමින් හා අති නවීන තාක්ෂණය හා බැඳී යටිතල පහසුකම් වර්ධනය කිරීම මගින් අපි මෙම ඉලක්කය සපුරා ගන්නෙමු. අපගේ සෑම ක්‍රියාවකදීම ජාතික වැදගත්කම උච්චස්ථානයේ තබා ගනිමින් පැහැදිලිව නිර්ණය කළ උපාය මාර්ග අප වෙළඳපොල නායකත්වය උසස් කර ලීමටත්, ලාභදායිත්වය හා වර්ධනය, තිරසාරව පවත්වා ගැනීමටත් අපි නිබඳවම කටයුතු කරන්නෙමු.

වටිනාකම්

- **සංස්කෘතිය** : නව සොයා ගැනීම් කෙරෙහි යොමු වෙමින්, සහයෝගයෙන් හා කාර්යක්ෂමව ගනුදෙනු කරුවන් පෙරමුණ තබා ක්‍රියා කරමින් අපි සාර්ථක වන්නෙමු.
- **ව්‍යාපාර** : විවිධාංගීකරණය වූ මාධ්‍ය හා වෙළඳපල පිළිබඳ මිළඟ පරම්පරාව අපි සංවර්ධනය කරන්නෙමු.
- **ලේඛන කලාව** : විශ්වාසනීය හා උසස් තත්ත්වයේ දේශීය වශයෙන් නැඹුරු වූ මාධ්‍ය ආවරණයක් සලසන්නෙමු
- **සේවා** : ගනුදෙනුකරුවන්ට අවශ්‍ය කුමක්ද, කුමන වේලාවටද, කුමන ස්ථානයේද, හා අවශ්‍ය කෙසේද යන්න පිළිබඳ තීරණය කිරීමට නිදහස අපි ඔවුනට ලබා දෙන්නෙමු.
- **තත්ත්වය** : මෙහෙයුම් කාර්යක්‍ෂමතාවයන් තිරසාරව පවත්වා ගැනීමටත්, වැඩිදියුණු කිරීමටත්, අප ක්‍රියාකාරකම් සෑම අංශයකම වඩාත් හොඳින් ක්‍රියාවට නැංවීමට අපි ඉමහත් පරිශ්‍රමයක් දරන්නෙමු.
- **දර්ශනය** : අප සෑම ක්‍රියාවකදීම ජාතික වැදගත්කම ප්‍රමුඛ ස්ථානයේ ලා සලකමු.
- **කණ්ඩායම** : විවිධාංගිකරණය අගයන අතර ඉහළ කාර්ය සාධනය අගය කරන්නෙමු.

පටුන

විශේෂිත මූල්‍ය දත්තයන්	1
සභාපතිතුමාගේ සමාලෝචනය	2-4
ශ්‍රී ලංකා ආර්ථිකය කෙටියෙන්	5
මූල්‍ය සමාලෝචනය	6-9
මානව සම්පත්	10-12
අවදනම් කළමනාකරණය	13
ආයතනික පාලනය	14
අධ්‍යක්‍ෂකවරුන්ගේ වාර්තාව	15-16
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්‍ෂවරුන්ගේ වගකීම	17
විගණකාධිපතිතුමාගේ වාර්තාව	18-23
විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් සභාපතිතුමාගේ අදහස් දැක්වීම	24-28
ආදයම් ප්‍රකාශය	29
ශේෂ පත්‍රය	30
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	31-32
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය	33
ගිණුම්කරණ ප්‍රතිපත්ති	34-36
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්	37-43
එකතුකළ වටිනාකම් ප්‍රකාශය	44
දස අවුරුදු සාරාංශය	45
කොටස් පිළිබඳ තොරතුරු	46
ආයතනික තොරතුරු	47

විශේෂිත වූ මූල්‍ය දත්තයන්

		2011	2010	වෙනස	වෙනස %
විශේෂිත ඉපයුම් සහ අනුපාත					
පිරිවැටුම	රු. '000	3,075,267	2,920,218	155,049	5.3
බදු වලට පෙර ලාභය	රු. '000	14,036	(359,782)	373,818	103.9
බදු වලට පසු ලාභය	රු. '000	(11,037)	(337,613)	326,576	96.7
සේවකයෙක් සඳහා පිරිවැටුම	රු. '000	1,514	1,387	127	9.1
සේවකයෙක් සඳහා බදු වලට පෙර ලාභය	රු. '000	7	(171)	177,83	104.0
ජාතික ආර්ථිකයට දායකත්වය	රු. '000	569,134	609,575	(40,441)	(6.6)
කෙටිකාලීන ආයෝජන වලින් ලද ආදායම	රු. '000	13,304	13,515	(211)	(1.6)
මූල්‍ය පිරිවැය	රු. '000	111,715	70,806	40,910	57.8
කොටසක ඉපයීම්	රු.	(3.17)	(96.91)	93.74	96.7
පිරිවැටුම මත බදු ගෙවීමට පෙර ලාභය	%	0.46	(12.32)	12.78	103.7
යෙදූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ	%	(4.05)	(119.15)	115.09	96.6

විශේෂිත වූ ශේෂ පත්‍ර දත්ත හා අනුපාත (ශේෂ පත්‍ර දිනට)

මුළු වත්කම්	රු. '000	1,824,650	1,865,262	(40,611)	(2.2)
දේපල පිරියත හා උපකරණ	රු. '000	289,224	226,910	62,314	27.5
කොටස් හිමියන්ගේ අරමුදල්	රු. '000	272,320	283,357	(11,037)	(3.9)
නිකුත් කළ කොටස් ප්‍රමාණය	'000	3,484	3,484	-	-
කොටසක ශුද්ධ වත්කම	රු.	78	81	(3.17)	(3.9)
ජංගම අනුපාතය		1.44	1.46	(0.02)	(1.4)
ක්ෂණික අනුපාතය		0.95	1.04	(0.09)	(8.7)

රටේ ආර්ථික කාර්ය සාධනය සහ අනාගතය

යුද්ධය අවසන්වීමත් සමග නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ මෙතෙක් වාර්තා කළ ඉහළම ආර්ථික වර්ධනවේගය වන 8.3% 2011 දී වාර්තා විය. ඒ අනුව මෙම 8% ක වැඩි ආර්ථිකවර්ධන වේගය නොකඩවා වසර දෙකක් තිස්සේ අඛණ්ඩවම අත්විඳීමට හැකිවී ඇත. වසර ගණනාවක සිට පැවති ආර්ථික තත්ත්වය සහ මෙතෙක් නොවිසඳුන ලෝක ආර්ථික අර්බුදය හමුවේ මෙම යළි පිබිදීම දිරිගන්වන සුළුය.

මෙතෙක් අර්බුදකාරීව තිබූ උතුරු නැගෙනහිර, යළි ඇරඹි ආර්ථික ක්‍රියාවලියේ ඇරඹුම මත ඇති වූ වාසිදායක මහාපරිමාණ ආර්ථික තත්ත්වය මධ්‍යයේ පාරිභෝගික ඉල්ලුම සහ ආයෝජකයින්ගේ ආත්ම විශ්වාසය 2011 වසර තුළ මනාව වර්ධනය වී ඇත. ආර්ථික ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා සමාලෝචනයට භාජනය වූ වසර තුළ රජය දිවයින පුරා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජනයන් කර ඇත.

ගෘහස්ථ සැපයුම් තත්ත්වයේ ඉහළයාමත්, විචක්ෂණශීලි ද්‍රවශීලතා කළමනාකරණයත් තනි ඉලක්කමේ උද්ධමනයක් ස්ථායිකිරීමට උපකරණයක් වශයෙන් භාවිතා විය. මූල්‍ය ප්‍රතිපත්තිය සරල කිරීමට එය හේතු විය. ණය වර්ධනය අඩුකිරීමේ පියවරක් වශයෙන් 2012 වසරේ පොලී අනුපාත අඛණ්ඩ ස්ථාවරත්වයකින් පැවතුනි.

තරමක ස්ථාවර විනිමය අනුපාතයක් පවත්වාගෙන යාමෙන් පසු අහිතකර ගෝලීය සංවර්ධනය, ආනයනයන්හි මිල ඉහළයාම් තුළ අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයක් මධ්‍යයේ පෙර සුදානමක් අනුගමනය කරමින් රජය 3% රුපියලේ අගය අව ප්‍රමාණය කිරීම නිවේදනය කළේ ය. මෙම වෙනස රුපියලේ අගය දුර්වලවී එයට ආවේනික තත්ත්වයට පත් වී ස්ථායිවීමට හේතු විය.

සමාලෝචනයට භාජනය වන වසරේ අය වැයෙන් ප්‍රකාශයට පත් කරන ලද බදු ප්‍රතිශෝධන මගින් රජයේ ආදායම වැඩිකර ගැනීම සඳහා සරල බව, බදු පදනම පුළුල් කිරීම, බදු අනුකූලතා මට්ටමේ වැඩිදියුණු කිරීම අරමුණු කර ඇත. උතුරු නැගෙනහිර බලය වැඩිවීමත් සමග බැංකු මුදල් සහ කල්බදු අංශයන්හි කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. මහ බැංකුවේ මූල්‍යමය ස්ථාවරභාවය තබාගැනීමට පාරිභෝගික ආරක්ෂාව වැඩිදියුණු කිරීමට සහ අනවසර තැන්පත් භාරගන්නා ආයතන සමග තරග වැදීමට නව මූල්‍යමය පනතක් සහ බැංකු පනත සංශෝධනය කිරීම මගින් නියාමන රාමුවක් ශක්තිමත් කර ඇත.

සමාගමේ කාර්ය සාධනය

සාර්ව ආර්ථික පරිසරයේ වර්ධනය මධ්‍යයේ ඇතිවූ යහපත් ව්‍යාපාරික පසුබිම සමාගමේ ලාභදායීත්වය වර්ධනය කිරීමට ඉවහල් විය. සමාලෝචනයට භාජනය වූ කාලපරිච්ඡේදයේදී බදු අඩුකිරීමට පෙර ලාභය රු. මිලියන 14 ක් වාර්තා කිරීමට අපට හැකිවිය. 2008 හා 2010 වර්ෂයන් තුළ පිරිනමන ලද ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනාක්‍රම දෙකෙන් පසු අනුගමනය කරන ලද අඛණ්ඩ ශක්තිමත් පිරිවැය පාලන ක්‍රමවේදයන් නිසා දැන්වීම් ආදායම 13% කින් සහ විකුණුම් ආදායම 14% කින් වැඩිවීම නිසා මුළු ආදායම 5% කින් වැඩිවිය. පෙර වසර හා සසඳා බැලීමේ දී මුළු වියදම 12% කින් අඩුකර ගැනීමට හැකිවිය. මුද්‍රණ කඩදාසි ආනයනය යථාර්ථකරණය කිරීම, පුවත්පතේ ඉඩ උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම, මුද්‍රණ කඩදාසි මිලදී ගැනීමේ දී වඩාත් වාසිදායක කොන්දේසි යටතේ ඒවා ලබාගැනීමට දැක් වූ දැඩි සුපරීක්ෂකාරී බව, නිෂ්පාදනයට සම්බන්ධ නැති අතිකාල දීමනාවල පාලනයත් සමග ස්වේච්ඡාවෙන් විශ්‍රාමගැන්වීමේ යෝජනාක්‍රමයෙන් ඉතිරි වූ සැලකිය යුතු තරමේ ඉතිරියත් පිරිවැය අඩුකරගැනීමට ඉවහල් විය.

මුද්‍රණ කඩදාසි, තහඩු සහ යන්ත්‍රෝපකරණ වැනි මූලික ආනයන මත විශාල ලෙස යැපෙන්නන්වන අපි ගෝලීය මිල ප්‍රවනතාවයන්ට නිරන්තරයෙන් ගොදුරුවන්නෙමු. බොහෝවිට මෙවැනි ආනයනයන් සඳහා මූල්‍ය සම්පාදනයන් සැපයෙන්නේ බැංකු ණය මගින් විශාල පිරිවැයකටය. මෙම සියලු නිමිති පහලවන්නේ අපට ඉතා අසීරුවෙන් ළඟාකරගැනීමට අවශ්‍ය දැරිය හැකි ලාභදායකත්වයන් වෙනුවෙනි.

බෙදාහැරීම

අපි දිනපතා ප්‍රධාන පුවත්පත් 3 ක් සහ සතිපතා ප්‍රධාන පුවත්පත් 3 ක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ප්‍රකාශයට පත්කරන්නෙමු. 2011 දෙසැම්බර් 31 දිනවන විට අප නිෂ්පාදන ක්‍රියාවලියට විවිධ රුචිකම් ඇති පාඨක කණ්ඩායම්

ඉලක්කකරගනිමින් තවත් සතිපතා පුවත්පත් 8 ක් සහ සඟරා 4 ක් සහිතව මුළු නිෂ්පාදනය 18 කි. ඉතා සතුටුදායක ලෙස අලෙවිය වර්ධනය වූ නව සතිපතා පුවත්පත් 3 ක් අපි හඳුන්වාදුන්නෙමු. 2012 අද වන විට තවත් සතිපතා පුවත්පත් 2 ක් සහ සඟරාවක් නිෂ්පාදන ක්‍රියාවලියට එකතු කිරීමට අපට හැකි විය. මෙම සියලු ප්‍රකාශන යාපන අර්ධද්වීපය ඇතුලු මුළු දිවයින පුරාම අපගේ වාහනවලින්, උපකොන්ත්‍රාත්කරුවන් මගින් සහ ලංගම බස් රථ මගින් බෙදාහරිනු ලැබේ. බෙදාහැරීමේ ජාලය ශක්තිමත් කිරීමේ අරමුණින් අප ප්‍රාදේශීය කාර්යාල සහ නියෝජිතයින් කිහිප දෙනෙක් පත්කර ඇත. මෙම නව බෙදාහැරීමේ මාර්ග සමග නුවර, අනුරාධපුර, කතරගම, මාතර සහ යාපනයේ ඇති අපගේ ශාඛා කාර්යාල බෙදාහැරීමේ නව මං පෙත් විවරකරමින් පාඨකයන්ට කඩිනම් සේවයක් සලසා ඇත. ජනතාවගේ දැනුම වර්ධනය කිරීම සඳහා අප දිවයින පුරා ආරම්භකළ 5 වසර ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ, සෞඛ්‍ය කඳවුරු, සංගීත සංදර්ශන පාසල් ළමුන් සහ සාමාන්‍ය ජනතාව අතර ඉතා ජනප්‍රිය වී ඇත.

දැන්වීම්

සමාගම දැන්වීම ආදායම ශක්තිමත් කිරීමට වසරක් මත වසරක් යන පදනම යොදාගත් අතර 2011 වසර තුළ රු.මිලියන 2274.7 ක දැන්වීම් ආදායමක් ඉපයීමට අපට හැකිවිය. මෙය 2010 හා සසඳනවිට රු.මිලියන 259.6 ක වැඩිවීමකි. පූර්ණ ඒකාබද්ධිත දැන්වීම් සම්පත් කළමනාකාර පද්ධතිය (ADPRO) ජාල පදනම් දැන්වීම් දැමීමේ ක්‍රමය, ලංකා බැංකු ශාඛා මගින් ලුහුඬු දැන්වීම් භාරගැනීම, ශාඛා හා නියෝජිත ජාලය ශක්තිමත් කිරීම ප්‍රධාන වශයෙන්ම දැන්වීම් ආදායම වැඩිකිරීමට දායක වී ඇත.

වෙළඳ මුද්‍රණ අංශය

සමාගමේ වෙළඳ මුද්‍රණ අංශය අතිරේක වර්ණ 4 ක ඒකකයක් WEB MAGNUM මුද්‍රණ යන්ත්‍රයට එකතු කරමින්, CTP යන්ත්‍රයට මුද්‍රණ තහඩු සැකසීමට ඩිජිටල් පරිගණක හඳුන්වා දෙමින් වර්ණ 04 SHEET-FED මුද්‍රණ යන්ත්‍රයක් අත්පත්කර ගනිමින් ඩිජිටල් තාක්ෂණය සහිත නවීන යන්ත්‍රෝපකරණ මගින් ඔවුන්ගේ කාර්මික ධාරිතාවය පුළුල් කරන ලදී. මෙම සංවර්ධනය මගින් නිෂ්පාදනය වැඩිකිරීම, මුද්‍රණ ගුණාත්මක බව සහ නිෂ්පාදනයේ වේගවත් බව ඇතිකරන ලදී. මෙම තාක්ෂණික සංවර්ධනයන් ආදායම ඉහළ තත්ත්වයක පවත්වාගත් අතර එමගින් රජයේ පාසල් පෙළ පොත් ටෙන්ඩරයේ සහ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ දුරකථන නාමාවලි ටෙන්ඩරයේ සැලකිය යුතු තරම් ප්‍රමාණයක් ලබාගැනීමට හැකිවිය.

ධාරිතාවය වර්ධනය කිරීම

තරගයේ ඉදිරියෙන් සිටීමට ඉහළම තරගකාරී ව්‍යාපාරික පරිසරය තුළ ලාභය වර්ධනය කිරීම අවශ්‍යය. මේ සඳහා නිරන්තරයෙන් යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම අවශ්‍යය. මේ අනුව අනාගතයේ මුල් තැනකට ඒ යැයි විශ්වාසකරණ වාණිජ මුද්‍රණ අංශයේ ශක්තිය වර්ධනය කිරීම පිණිස සමාලෝචනයට භාජනය වන වසරේ GOSS MAGNUM මුද්‍රණයන්ත්‍රයට වර්ණ 4 ක ඒකකයක් සහ CTP යන්ත්‍රයත් මිලදී ගැනීමට රුපියල් මිලියන 92.3 ක් ආයෝජනය කර ඇත. අපි දැනටමත් වර්ණ 4 SHEET-FED යන්ත්‍රයක් SADDLE STITCHING යන්ත්‍රයක් සහ COUNTER STACKER යන්ත්‍රයක් සඳහා රුපියල් මිලියන 122.2 ක් ආයෝජනය කිරීමට කැපවී ඇත. මෙය සවිකිරීම් කටයුතු 2012 සිදුකිරීමට බලාපොරොත්තුවේ. ඔබ සමාගම සමාගමේ මුද්‍රණ ධාරිතාවේ වර්ධනය සඳහා මෙම ආයෝජනයන් නුදුරු අනාගතයේ දී දායක වේ යයි විශ්වාසය පළකරයි.

තොරතුරු තාක්ෂණය

තාක්ෂණය විසින් මෙහෙයවන පරිසරයක ජීවත්වන විට නිරන්තර වෙනස් වීම්වලට භාජනය වේ. ඔබගේ සමාගම අපගේ බොහෝ ක්‍රියාකාරකම්වලට තොරතුරු තාක්ෂණය ඉවහල් වන බව සහ වැදගත් වන බව තේරුම් ගැනීමට තරම් බුද්ධිමත්ය. සමාලෝචනයට භාජනය වන වසර තුළ තොරතුරු තාක්ෂණය සඳහා අප කළ ආයෝජනයන් සිත්ගන්නා සුළු මට්ටමක පවතී. * පෙර මුද්‍රණ අංශය, තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සහ දත්ත සැකසුම් යන දෙපාර්තමේන්තු වල සෘජු අධීක්ෂණය යටතේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති 2 වන දැන්වීම් ඉන්වොයිස්පත් සෘජුවම පොදු ලෙජරයට මාරුකිරීම සහ ERP පදනම් කරගත් ගිණුම් පද්ධතිය නිමකිරීමට හැකිවීමෙන් සමාගමේ ගිණුම් ක්‍රියාවලිය සරල වීම විශාල වෙනස්වීමකට

තුඩුදුන්බව අප ඉතා සතුටින් සඳහන් කරමු. තවදුරටත් මෙම මාගීයේ ගමන්කරමින් තොරතුරු තාක්ෂණය බොහෝ ක්‍රියාවලින් සඳහා යොදා ගැනීමට අප බලාපොරොත්තු වෙමු. TRIPS ගිවිසුමෙන් ආරක්ෂාවී සිටින මෘදුකාංග වෙළෙන්දන්ගේ අධි මිලැති බලපත්‍ර පිරිවැය අප මුහුණපාන එක් ප්‍රධාන බාධාවක් වී ඇත. අතිරේක තොරතුරු තාක්ෂණ මෘදුකාංග 2 දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. එය කතීා මණ්ඩල කටයුතු සුමට කිරීමට අරමුණු කොට ඇත. මෙම ක්‍රියාවලින් මගින් හසුරුවා ගැනීමට දුෂ්කර. අතින්කරන. කාලය නාස්තිකරන ක්‍රියාවලියන් අවම කර ගැනීමට බලාපොරොත්තුවෙමු.

සාමූහික සමාජ වගකීම

ප්‍රමුඛ පෙළේ මුද්‍රිත මාධ්‍ය සමාගමක් වශයෙන් අපි ජනතා අපේක්ෂාවන් පිළිබඳව සැලකිලිමත්ය. එම නිසා අප සංස්කෘතික විශේෂාංග වන ආගමික, ජාතික සහ සංස්කෘතික උත්සව සඳහා සහායවීමට දැඩිව ඇපකැපවෙමු. මිහින්තලේ ආලෝක පූජා පිංකම, දැයට කිරුළ ප්‍රදර්ශනය, වසරේ දක්ෂතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා තරගය, අමාත්‍යාංශ වලට ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීමට සහායවීම, අමාදහර වෙසක් උත්සවය, පුවත්පත සමග නොමිලේ නිකුත් කරන ගැසට් පත්‍රය, පළාත්බදව පැවැත්වෙන සංගීත සංදශීන වලට අනුග්‍රහකත්වය ආදිය මුලිකාංගයන්ගෙන් කිහිපයකි. මීට අමතරව පූණී රක්ෂණ යෝජනා ක්‍රමයත්, ප්‍රසාද දීමනා, අන් සමාගම්වලට වඩා ඉහළින් පවත්වාගෙනයන අර්ථසාධක අරමුදල් දායක මුදල. සිත් ඇදගන්නා ජීවන වියදම් දීමනාව, දීප ව්‍යාප්ත ශිෂ්‍යත්ව යෝජනාක්‍රම පාසල් ළමුන් සඳහා නොමිලේ පිරිනමන පාසල් පොත් සහ බෑග්, වැනි සුබසාධක කටයුතු රාශියක් මගින් අපි අපේ සේවකයින් හා ඔවුන්ගේ යැපෙන්නන් රැක බලාගනිමු. මේ අයුරින් හෝ සමාජයේ යම් කොටසකට හෝ ජීවන තත්ත්වය වර්‍ධනය වීම පිළිබඳව අපි ඉතා ආඩම්බරවෙමු. ව්‍යාපාරයක් දියුණුවීමට නිරෝගීබව හා ශ්‍රම බලකායේ තෘප්තිමත් බව අත්‍යවශ්‍ය බව අපි තරයේ විශ්වාස කරමු.

ඇගයීම

යහපත් සහ අයහපත් කාලවකවානු තුළ තමන්ගේ නොමසුරු සහයෝගය දැක්වූ මාගේ අධ්‍යක්ෂ මණ්ඩලයටත්, කළමනාකාරීත්ව කණ්ඩායමටත් සහ සියලුම මට්ටම්වල සේවකයින්ටත් මම ස්තූති වන්ත වෙමි. සේවක සහයෝගය නොලැබුනානම් ඔබගේ සමාගම සමාලෝචනයට භාජනය වන වසරේ මුදුන්පත්කරගත් ජයග්‍රහණයන් නොලැබී යෑමට තිබුනි. යන්ත්‍රෝපකරණ, ගොඩනැගිලි ආදිය ආදායම් උපදවන ස්ථාවර වත්කම් වුවත් ශේෂපත්‍රයේ සටහන් නොවන එකම වටිනා වත්කම සේවකයින් බව මම නොපැකිළිවම ප්‍රකාශකරමි. ලේක්හවුසිය ශක්තියෙන් ශක්තියට ඉදිරියට යන්නේ සේවක සහයෝගයෙන් **දෝයි මාතුල කුඩා සැකයක් මතු වී ඇත**. අවු. 100 ට වඩා පැරණි අප ආයතනය ලෝක උරුමයක් ලෙස හඳුන්වා ඇත. එම නිසා මෙම ගෞරවනීය ස්ථානය අප ආදි කතෘ සභාපතිතුමන්ගේ අභිලාෂයන්ට අනුව නිරන්තරයෙන් ජයග්‍රහණයන් ලබමින් පවතින බව මම නැවත නැවතත් පවසා සිටිමි.

අනාගතය

සමාගමේ අනාගතය පිළිබඳව අප තුළ ඇත්තේ සර්‍වසුබවාදී ආකල්පයකි. 2011 වසර එලදායී අයුරින් අවසන් විය. අනාගතයත් මේ ආකාරයෙන්ම වර්‍ධනය වේ යන්න අපගේ අභිලාෂයයි. සම්පත් සපිරි ශ්‍රම බලකායක්, වෘත්තීය සුදුසුකම්ලත් කළමනාකරීත්ව කණ්ඩායමක් අයත්වීම, සෑම දෙයක්ම සර්‍ව සුබවාදී වීමට හේතුවේ යයි අපි සිතමු. අපි නිශ්චල කාර්මික පරිසරයකින් යුතු කාල පරිච්ඡේදයත් ගතකර ඇත්තෙමු. අපගේ වන්දි පැකේජයන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ සමාගම්වල තරඟකාරීත්වයට සහ සැසඳීම්වලට වඩා ඉහළ තලයක පවතී. මෑතකදී අත්පත් කරගන්නා ලද යන්ත්‍රෝපකරණ පූණීධාරීතාවක් එක්කර ඇති අතර අප ප්‍රකාශනවලට ද වටිනාකමක් එකතුකර ඇති බව අපි සාක්ෂි දරමු.

බන්දුල පද්මකුමාර
සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා ආර්ථිකය කෙටියෙන්

ප්‍රධාන ආර්ථික දත්ත

	2006	2007	2008	2009	2010 (අ)	2011
ජන විකාශය						
වසර මැද ජනගහනය (පුද්ගලයින් '000)	19,886	20,010	20,217	20,450	20,653	20,869
ජනගහන වර්ධනය (%)	1.1	1.1	1.0	1.1	1.0	1.0
ශ්‍රම බලකාය (පුද්ගලයින් '000)	7,599	7,489	8,082	8,074	8,108	8,236
රැකියා වියුක්ති අනුපාතය (ශ්‍රම බලකාය %)	6.5	6.0	5.4	5.8	4.9	4.2
නිපැයුම						
වෙළඳපොල වටිනාකමට දළ දේශීය නිෂ්පාදනය (රු. බිලියන)	2,939	3,579	4,411	4,835	5,602	6,543
වෙළඳපොල වටිනාකමට ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනය (රු)	147,776	178,845	218,167	236,445	271,259	313,511
සත්‍ය නිපැයුම (වෙනස %)						
දළ දේශීය නිෂ්පාදනය	7.7	6.8	6.0	3.5	8.0	8.3
වැටුප් සහ මිල ගණන් (වෙනස %)						
කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2002 = 100) වාර්ෂික සාමාන්‍ය	13.5	18.8	14.4	4.8	6.9	-
නාමික වැටුප් අනුපාත දර්ශකය පඩිපාලක සභා සේවකයින් සඳහා	2.1	21.4	25.6	4.9	32.0	4.6
විනිමය අනුපාත						
වාර්ෂික සාමාන්‍ය රු./ඇමරිකන් ඩොලර්	103.96	110.62	108.33	114.94	113.06	110.57
වසර අවසානය රු./ඇමරිකන් ඩොලර්	107.71	108.72	113.14	114.38	110.95	113.90
පොලී අනුපාත (වර්ෂය අවසානයේ වාර්ෂික %)						
නැවත මිලදී ගැනීම් අනුපාතය (දිනකට)	10.00	10.50	10.50	7.50	7.25	7.00
අවලංගුකොට නැවත මිලදී ගැනීම් අනුපාතය (දිනකට)	11.50	12.00	12.00	9.75	9.00	8.50
භාණ්ඩාගාර බිල්පත් අනුපාතය දින 91	12.76	21.30	17.33	7.73	7.24	8.68
දින 364	12.96	19.96	19.12	9.33	7.55	9.31
තැන්පතු අනුපාත						
වෙළඳ බැංකුවල බර තැබූ සාමාන්‍ය තැන්පතු අනුපාතය (AWDR)	7.60	10.31	11.63	8.01	6.23	7.24
වෙළඳ බැංකුවල මාස 12 ස්ථාවර තැන්පතු (උපරිම)	14.00	20.00	20.25	19.00	17.00	11.00
ණය පොලී අනුපාතය						
වෙළඳ බැංකුවල බර තැබූ සාමාන්‍ය මූලික ණය පොලී අනුපාතය (AWPR)	15.19	17.95	18.50	10.91	9.29	10.77
ප්‍රාග්ධන වෙළඳ පොළ						
සියලු කොටස් මිල දර්ශකය (1985 = 100)	2,722.4	2,541.0	1,503.0	3,385.6	6,635.9	6,074.4
මිලංක මිල දර්ශකය (1998 දෙසැ. = 100)	3,711.8	3,291.9	1,631.3	3,849.4	7,061.5	5,229.2
වෙළඳපොළ ප්‍රාග්ධනය (රු. බිලියන)	834.8	820.7	488.8	1,092.1	2,210.5	2,213.9

(අ) වෙන්කරන ලද

දත්තයන් : ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව 2011

1) මෙහෙයුම් ප්‍රතිඵලය

2011 වර්ෂයේදී සමාගම රුපියල් මිලියන 14 ක බදු ගෙවීමට පෙර ලාභයක් උපයාගන්නා ලදී. මෙය 2010 වර්ෂයට වඩා රුපියල් මිලියන 373.8 ක වැඩිවීමකි. මුළු ආදායමේ වැඩිවීම ආන්තික වැඩිවීමකි. පිරිවැයේ මනා පාලනය බදු ගෙවීමට පෙර ලාභය වැඩිවීමට බෙහෙවින් දායක විය.

මෙහෙයුම් ප්‍රතිඵල සැසඳීම

අයිතම	2011	2010
ආදායම	3,075.3	2,920.2
විකුණුම් පිරිවැය	(1,524.8)	(1,504.8)
දල ලාභය	1,550.5	1,415.4
වෙනත් ආදායම්	117.3	107.0
පරිපාලන වියදම්	(1,230.2)	(1,319.6)
බෙදාහැරීමේ වියදම්	(311.9)	(319.8)
මූල්‍ය වියදම්	(117.7)	(70.8)
ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ වියදම	0.0	(172.0)
බදු ගෙවීමට පෙර ලාභය	14.0	(359.8)

බදුගෙවීමට පෙර සංචලනය



2) ආදායම

මුළු ආදායම

වර්ෂයේ මුළු ආදායම රුපියල් මිලියන 155.1 කින් වැඩිවිය. පහත සාරාංශගත සටහනට අනුව 2010 වර්ෂයට වඩා 5% වර්ධනයකි.

අයිතම	2010 රු. මිලියන	2011 රු. මිලියන	වර්ධනය %	වර්ධනය %
වෙළඳ දැන්වීම් ආදායම	2,015.1	2,274.7	259.6	13%
පුවත්පත් අලෙවි ආදායම	592.5	675.0	82.5	14%
වෙළඳ මුද්‍රණ ආදායම	310.0	124.3	(186.3)	(60%)
වාර්ෂික ආදායම	2.0	1.3	(0.7)	(35%)
ආදායම්වල එකතුව	2,920.0	3,075.3	155.1	5%

ආදායම් වල එකතුව
රු. මිලියන වලින්



දැන්වීම් ආදායම

දැන්වීම් ආදායම සමාගමේ ප්‍රධාන ආදායම් ප්‍රභවයයි. 2011 වර්ෂයේ දී එය රු. මිලියන 259.7 වූ අතර 13% වර්ධනයක් වාර්තා කරන ලදී. ඉලෙක්ට්‍රොනික හා අන්තර්ජාලය මත පදනම් වූ දැන්වීම් ප්‍රමාණය වෙත වෙළඳපොළ යොමුවීම හමුවේ දැන්වීම් E R P ක්‍රමය ක්‍රියාත්මක කිරීමත් සමග ඇති වූ විශිෂ්ට පාරිභෝගික සේවයත් ප්‍රධාන වශයෙන් මෙම ජයග්‍රහණයට බලපෑවේය.

දැන්වීම් ආදායම
රු. මිලියන වලින්



බෙදාහැරීම් ආදායම

අනාගත තාක්ෂණික සංවර්ධනය අභියෝගයක් වුවත් 2011 වර්ෂයේ දී සමාගම විකුණුම් ආදායම 14% ක වැඩිවීමක් වාර්තා කිරීමට සමත්විය. ආදායම වැඩිවීම රු. මිලියන 82.5 කි.

මුළු අලෙවි ආදායම
රු. මිලියන වලින්



වාණිජ මුද්‍රණ අංශයේ ආදායම

පසුගිය වසර කීපය මුළුල්ලේම අප වෙළඳ මුද්‍රණ අංශයේ ධාරිතාව සහ ගුණාත්මක බව පුළුල් කර ඇත. එම නිසා රජයේ පාසැල් පෙළපොත් මුද්‍රණයේ ටෙන්ඩරයෙන් සහ ශ්‍රී ලංකා ටෙලිකොම් ජාතික දුරකථන නාමාවලියේ මුද්‍රණයෙන් සැලකිය යුතු තරම් ප්‍රමාණයක් ලබාගැනීමට හැකිවිය. 2011 වසරේ රජයේ පෙළ පොත් මුද්‍රණයේ වූ දැඩි ටෙන්ඩර් පටිපාටිය නිසා අපට මෙම ජයග්‍රහණයන් කරා ළඟාවීමට නොහැකි විය. මෙම තත්ත්වය ප්‍රධාන වශයෙන්ම වෙළඳ මුද්‍රණ අංශයේ ආදායම අඩුවීමට බලපා ඇත.

බාහිර වැඩවලට අමතරව, වෙළඳ මුද්‍රණ අංශය ආයතනයේ පුවත්පත් සඳහා වටිනාකම් එකතු කිරීම සහ වෙළඳ අංශයේ සම්ප්‍රයුක්ත පිරිවැටුම පහත පරිදි වේ.

අයිතම	**2010 රු.මිලියන**	**2011 රු.මිලියන**
බාහිර ආදායම	310.6	124.3
අභ්‍යන්තර ආදායම	226.8	283.4
මුළු ආදායම	**537.4**	**407.7**

වාණිජ මුද්‍රණ අංශයේ ආදායම
රු. මිලියන වලින්



3) විකුණුම් පිරිවැය

විකුණුම් පිරිවැයේ විශාලම කොටස නියෝජනය වන්නේ පුවත්පත් මුද්‍රණ අමුද්‍රව්‍ය මිලදී ගැනීමයි. 2011 වර්ෂයේ දී එය විකුණුම් පිරිවැයෙන් 79% වූ අතර 2010 වර්ෂයේ දී 70% ක් විය. 2011 දී මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ මුද්‍රණ කඩදාසිවල ගෝලීය මිල ඉහළයාමත් විනිමය අනුපාත වල ඉහළ යාමත්ය.

විකුණුම් පිරිවැය - 2011



විකුණුම් පිරිවැය - 2010



4) වියදම්

පහත දැක්වෙන විශ්ලේෂණ සටහනට අනුව මුළු වියදම පසුගිය වසර හා සසඳන විට රු. මිලියන 228.5 කින් අඩු වී ඇත. මෙය පසුගිය වසර හා සසඳන විට 12% අඩුවීමකි. පසුගිය වසරේ සිදුකළ ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයේ වියදම 2011 මූල්‍ය වියදම වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

අයිතම	**2010-රු.මිලියන**	**2011-රු.මිලියන**	**වැඩිවීම -රු.මිලියන**	**වැඩිවීම -%**
පරිපාලන වියදම්	1,319.7	1,230.2	(89.5)	(7%)
බෙදාහැරීමේ වියදම්	319.8	311.9	(7.9)	(2%)
මූල්‍ය වියදම්	70.8	111.7	40.9	58%
ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ වියදම්	172.0	0.0	(172)	(100%)
මුළු වියදම්	**1,882.3**	**1,653.8**	**(228.5)**	**(12%)**

මුළු වියදම්
රු. මිලියන වලින්



ආයතනයේ ව්‍යාපාර කටයුතු වලදී මානව ප්‍රාග්ධනය ප්‍රධාන කොට හඳුනාගෙන ඇත. එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම මානව සම්පත දිගින් දිගටම අගය කරමින් සේවක මනාපය හඳුනාගෙන ඔවුන්ට හොඳින් සැලකීම අරමුණයි. ආයතනයේ අරමුණු සාර්ථක කරගැනීම පිණිස සංවිධානයට තම සේවාව ඉතා හොඳින් පිරිනමන සේවකයින් ආකර්ෂණීය කරගැනීමටත් වර්ධනය කරගැනීමටත් අවශ්‍යයි. එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම සේවක සුබසාධනය දිගින් දිගටම පවත්වාගෙන යාම තම වගකීමක් කොට සලකන අතර ඔවුන්ගේ ජීවිත වලට අනර්ඝ තත්ත්වයක් සහතික කරයි.

ස්ත්‍රී පුරුෂ භේදය අනුව (2011.12.31 දිනට)

	2011		2010	
	සංඛ්‍යාව	**%**	**සංඛ්‍යාව**	**%**
පිරිමි	1,641	81%	1,699	81%
ගැහැණු	390	19%	406	19%
එකතුව	2,031	100%	2,105	100%

ස්ත්‍රී පුරුෂ භේදය අනුව 2011



ස්ත්‍රී පුරුෂ භේදය අනුව 2010



සේවා විශ්ලේෂණය

සේවය කළ වර්ෂ ගණන	2011		2010	
	සංඛ්‍යාව	**%**	**සංඛ්‍යාව**	**%**
25 වැඩි	176	9%	190	9%
20-25	161	8%	172	8%
5-20	1,379	68%	1,319	63%
5 අඩු	315	16%	424	20%
එකතුව	**2,031**	**100%**	**2,105**	**100%**

සේවා විශ්ලේෂණය 2011



සේවා විශ්ලේෂණය 2010



මානව සම්පත්

වයස් විශ්ලේෂණය

වයස	2011		2010	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
50 ට වැඩි	372	18%	388	18%
50-40	658	32%	657	31%
40-30	705	35%	716	34%
30-20	296	15%	344	16%
එකතුව	2,031	100%	2,105	100%

වයස් විශ්ලේෂණය 2011



වයස් විශ්ලේෂණය 2010



සේවක බැඳියාව

	2011 රු. '000	2010 රු. '000
සේවකයෙකුගේ ආදායම	1,514	1,387
සේවකයෙකුට ශුද්ධ වත්කම්	134	135
සේවකයකුට එකතුකළ වටිනාකම	809	714

පුහුණුව

බාහිර දැනුම හා තරඟකාරීත්වය වර්ධනය සඳහා සේවකයින් අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩ සටහන්වලට යොමු කිරීම ආයතනය අවබෝධ කරගෙන තිබුණි. 2011 වර්ෂයේ දී සේවකයින් 53 දෙනෙකුට පමණ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් වලට සහභාගිවීමට අවස්ථාව සලසා දෙන ලදී.

ක්‍රීඩා

සමාගම නිරතුරුවම සේවකයින් ක්‍රීඩා කටයුතු සඳහා සහභාගීවීමට පොළඹවයි. අවශ්‍ය අවස්ථා හා පහසුකම් සැපයීම තුළින් සේවකයින්ට ඒ සඳහා සහභාගීවීමට හැකිවිය. 2011 වර්ෂයේ දී සැලකිය යුතු සේවක පිරිසක් නොයෙක් ආකාරයේ ක්‍රීඩා කටයුතු වලට සහභාගී වී ජයග්‍රහණ ලබාගෙන ඇත.

ජයග්‍රහණ

කැරම්

තරගාවලිය	ජයග්‍රහණ	නම්
ආධුනික - පිරිමි තේවල	ශූරතාව	සී. විජේගුණවර්ධන
ආධුනික - ගැහැණු යුගල	ශූරතාව	සී. විජේගුණවර්ධන, අයි.ඩී.බී. නයනසිරි
"බී" කාණ්ඩය - පිරිමි කණ්ඩායම	ශූරතාව	සී. විජේගුණවර්ධන, අයි.ඩී.බී. නයනසිරි, තිස්ස ධම්මික, එම්.පී. මංගල

ටේබල් ටෙනිස්

තරගාවලිය	ජයග්‍රහණ	නම්
ක්‍රීඩා සමාජ - කාන්තා කණ්ඩායම	ශූරතාව	දීපිකා රොද්‍රිගු, චම්පා ඩී. සිල්වා නදීෂා කුමාරසිංහ
පිළිමලුන් පිටුදැකීම - කාන්තා කණ්ඩායම	ශූරතාව	
ක්‍රීඩා සමාජ - මිශ්‍ර යුගල	ශූරතාව	දීපිකා රොද්‍රිගු සී. විජේගුණවර්ධන
පිළිමලුන් පිටුදැකීම - මිශ්‍ර යුගල	ශූරතාව	
විවෘත - මිශ්‍ර යුගල	ශූරතාව	
විවෘත - කාන්තා තනි	ශූරතාව	දීපිකා රොද්‍රිගු
ප්‍රවීන කාන්තා තනි	ශූරතාව	චම්පා ඩී. සිල්වා
විවෘත - කාන්තා යුගල	ශූරතාව	ඩී.එස්. රොද්‍රිගු, සී.ඩී. සිල්වා

සේවක සුබසාධන

සේවක සුබසාධන සැලසුම් වලට දයකත්වය

	2011 රු. මිලියන	2010 රු. මිලියන
සේවක අර්ථසාධක අරමුදලට සේව්‍ය දායකත්වය	74	75
සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට සේව්‍ය දායකත්වය	15	15
පාරිතෝෂිත වෙන්කිරීම්	52	81
සේවක සුබසාධනය	95	79

අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය

අවදානම වෙළෙඳපොළ ආර්ථිකයක තරග කිරීමේදී ඇතිවන නොවැළැක්විය හැකි අංගයකි. ආයතනයේ පරමාර්ථ හා අරමුණු ළඟා කරගනිමින් අඛණ්ඩ වර්ධනයක් ලබාගැනීම සඳහා අවදානම් කළමනාකරණය ඉතා වැදගත් සාධකයකි. ගන්නා වූ ක්‍රියාමාර්ගවල ඇගයීම පිණිස හා පරීක්ෂාව පිණිස මෙන්ම ආයෝජනය හා ක්‍රියාකාරකම් පිළිබඳව තීරණවලට ප්‍රතිඵල අන්තර්ගත කිරීමේදී සහ විවිධ වර්ගයේ අවදානම් - ඇගයීමට වගකිවයුතු සමාගමක් වශයෙන් අපට හැකි විය.

ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන ඉදිරියට කරගෙන යෑමේ ක්‍රියාවලියේදී අවදානම් හඳුනා ගැනීම සඳහා අගය කිරීම හා මුහුණපාන වැදගත් අවදානම් පාලනය කිරීම සඳහා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම අලුතින් අවදානම් කළමනාකරණ අංශයක් හඳුන්වා දෙන ලදී.

සමාගමේ අවදානම් කළමනාකරණ පද්ධතිය තුළ හඳුනාගත් ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර පහත පරිදි වේ.

ණය අවදනම් කළමනාකරණය

සමාගමේ ණය ගැතියන් එකඟවූ කාලසීමාව තුළ ණය මුදල් නොපියවීම නිසා සිදුවන මූල්‍යමය අලාභය ණය අවදානම ලෙස හඳුන්වයි. සැලකිය යුතු ආර්ථික අවපාතයන්, ස්වභාවික විපත් සහ සිවිල් සමාජයේ නොසන්සුන්තාවයන් යනාදී කරුණු ණය ආපසු අයකර ගැනීමේ කාර්ය ඵලය පහත හෙළීමට හේතු වේ.

මනා ඇගයීමකට ලක් කළ පසු පළපුරුදු සේවක මණ්ඩලයක් විසින් ණය අනුමත කිරීම් සිදුකරනු ලබයි. ණය අනුමත කිරීම සඳහා විවිධ තරාතිරමේ අධිකාරී බලයන් පවරා ඇත. අතිරේක ආරක්ෂණයක් ලෙස ගනුදෙනුකරුවන්ගෙන් ඇපකර හා තැන්පතු වැනි සුරැකුම් ලබා ගැනීමට කටයුතු කර ඇත. ණය දීමේ ක්‍රියා පද්ධතිය මනාව අනුගමනය කරන අතර අඩමාණ ණය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සිදු කර ඇත.

මෙහෙයුම් අවදනම් කළමනාකරණය

මෙහෙයුම් අවදානම් යනු මානව වැරදි, අයෝග්‍ය හෝ වැරදි අභ්‍යන්තර ක්‍රියාවලියන්, පද්ධති බිඳ වැටීම් සහ අභ්‍යන්තර පාලනයන් කඩකිරීම්, වංචා, නීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම හෝ සාධාරණ ලෙස දැකිය නොහැකි විපත් වැනි බාහිර සාධක හේතු කොටගෙන ඇතිවන අවදානම්ය.

ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ අත්‍යවශ්‍ය අංගයක් වන අභ්‍යන්තර විගණන අංශය විගණන කමිටුවට වාර්තා කරනු ලැබේ. සමාගමේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව අභ්‍යන්තර පාලන පද්ධතිය අනුගමනය කෙරෙන බවටත් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් පවතින බවටත් නිරතුරුව නිරීක්ෂණය කරනු ලබයි.

සමාගමේ ස්පෘශ්‍ය වත්කම් හඳුනාගත් අවදානම් සඳහා රක්ෂණය කර ඇත. සියලුම රක්ෂණ ඔප්පු වාර්ෂික ඇගයීමකට සහ විමර්ෂණයකට බඳුන් වෙයි.

නෛතික අවදනම් කළමනාකරණය

එහි සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී ආයතනය නෛතික ක්‍රියා මාර්ග සහ හිමිකම් පෑම සඳහා බඳුන්වේ. මෙම සියලුම කාර්යයන් අවදානමට හා අවිනිශ්චිතතාවයන්ට බඳුන් වන අතර ප්‍රතිඵලය කිසිම අවස්ථාවකදී නියත වශයෙන් කිව නොහැක. නීති අංශය අවදානම අවම කරගැනීම සඳහා සමාගමේ සියලුම ක්‍රියාමාර්ග හා සිදුවීම් නෛතික සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව සිදුවන බවට සහතික වෙයි.

මානව සම්පත් සම්බන්ධව අවදනම් කළමනාකරණය

ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස මානව ප්‍රාග්ධනය වර්ධනය කිරීම අත්‍යවශ්‍ය බව සමාගම සලකයි. සේවකයින් සුදුසු ලෙස දේශීය හා විදේශීය වශයෙන් සමාගමේ මිනිස් සම්පත් වර්ධන කාර්යයේදී පුහුණු කරනු ලැබේ.

සෞඛ්‍ය හා ආරක්ෂණ අවදනම් කළමනාකරණය

ව්‍යාපාරයේ අඛණ්ඩත්වයට හේතුවන මානව ප්‍රාග්ධනය අත්‍යවශ්‍ය බව සමාගම විශ්වාස කරන බැවින් වැඩකරන ස්ථානය තුළ සේවක සෞඛ්‍ය හා සුරක්ෂිතභාවය අවදානමට අදාළ ඒ ඒ ස්ථානයේ සේවය කරන පුහුණු වූ පිරිස් අනතුරු වීමට ඉඩකඩ ඇති යන්ත්‍රෝපකරණ පිළිබඳ සුරක්ෂිතභාවය පිළිබඳව පූර්ණ විධිවිධාන ගෙන ඇත.

තොරතුරු අවදනම් කළමනාකරණය

පරිගණක ක්‍රමයේ සහය ඇතිව සමාගමේ පාර්ශවකරුවන්ට අවශ්‍ය නිවැරදි හා අදාළ තොරතුරු දීමට සමාගමට හැකිවිය. කලින් කලට පද්ධතිය සමාලෝචනය කරන අතර මෘදුකාංග සපයන්නන් සමග නඩත්තු කිරීමේ ගිවිසුමක් ඇති කරගෙන ඇත.

සමාගම් මෙහෙයවන සහ පාලනය කරන ක්‍රම පද්ධතිය ආයතනික පාලනය යනුවෙන් අදහස් කරයි. ආයතනය සෑම අවස්ථාවකදීම එහි ක්‍රියාකාරිත්වය ඉහළ සදාචාරාත්මක ප්‍රමිතියකින් සහ සියලු පාර්ශවයන්ගේ අභිවෘද්ධිය පිණිස පවත්වාගෙන යන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වෙයි. මේ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ප්‍රකාශයට පත් කරන ලද ප්‍රතිපත්ති සහ යෝග්‍ය පරිචයන් මග පෙන්වයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සංයෝජනය

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිවරයෙකුගෙන් සහ විධායක අධ්‍යක්ෂවරු සතර දෙනෙකුගෙන් සමන්විතයි. මහා භාරකාර මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරු තිදෙනෙකු පත්කරනු ලබන අතර, කොටස් කරුවන් විසින් අධ්‍යක්ෂවරු දෙදෙනෙකු පත්කරනු ලබයි. සභාපතිතුමා අධ්‍යක්ෂක මණ්ඩලය පවත්වාගෙන යාමේ වගකීම දරන්නා ලෙස නිසි පාලනයක් පවත්වාගෙන යන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සඵලදායි ලෙස ඉටුකිරීමට අවශ්‍ය පහසුකම් සපයයි.

පවත්වනු ලැබූ ස්ථිර රැස්වීම් හා සහභාගි වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය සාමාන්‍යයෙන් දෙසතියකට වරක් රැස්වන අතර අවශ්‍ය අවස්ථාවලදී විශේෂ රැස්වීම් පවත්වනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය පුළුල් පරාසයක විහිදුන කුසලතාවලින් සහ පළපුරුද්දකින් සමන්විත වන අතර ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡා වලදී ස්වාධීන මතයක් සහ සැලකිය යුතු දැනුමක් එක් කරනු ලැබේ. 2011 වර්ෂය තුළදී රැස්වීම් 21 පැවැත්විය.
අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය පහත සඳහන් සටහනින් පෙන්නුම් කරයි.

අධ්‍යක්ෂකගේ නම	සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව
බන්දුල පද්මකුමාර මහතා	19
සන්ද්‍රසේගරම් සන්මුගනාදන් මහතා	07
ප්‍රසාද් රසංග හරිස්චන්ද්‍ර මහතා	19
උපුල් රංජන් සමරසිංහ දිසානායක මහතා	17
සීලරත්න සෙනරත් මහතා (නව පත්වීම)	19

රැස්වීම් කමිටු සහ එහි සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කරන ලද විගණන කමිටුව, ප්‍රාග්ධන වියදම්, ආනයනික සහ දේශීය මිලට ගැනීම් සඳහා වූ ප්‍රතිපාදන කමිටු අධ්‍යක්ෂවරුන්ගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගෙන් සමන්විතයි.

මූල්‍ය වාර්තාකරණය සහ විනිවිදභාවය

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, සංකල්ප සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව පිළියෙල කර ඇත. මෙම වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිතුමා විසින් විගණනය කර ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශයක් මෙම වාර්ෂික වාර්තාවේ 16 පිටුවේ සඳහන් වේ.

අනුකූලතා ගෙවීම්

සියලුම දන්නා ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත පරිදි ගෙවා ඇති බවත් සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම දායක මුදල් ගෙවා හෝ ගිණුම්කරණ ප්‍රතිපාදන සිදුකර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

අභ්‍යන්තර පාලනය

අභ්‍යන්තර පාලන ක්‍රම පද්ධතියක් සැලසුම් කරනුයේ නිසි කාර්ය හා බලතල විභජනය කිරීමෙන් හා අභ්‍යන්තර සහ බාහිර විගණන ක්‍රියාමාර්ග තුළින් මනා කාර්ය පටිපාටියක් මගින් වැරදි, මගහැරීම් වලින් සිදුවන අවදානම අවම කර ගැනීමට, ආයතනයේ වත්කම් ආරක්ෂා කර ගැනීමට සහ ගිණුම් පොත්පත් පවත්වාගෙන යාම සඳහාය.

ආයතනය තුළ ප්‍රමාණවත් සහ ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතික කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි. සමාගමේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව එදිනෙදා සිදුවන මූල්‍යමය සහ මූල්‍යමය නොවන කටයුතු නිරන්තරයෙන් විමර්ශණය කරයි.

කොටස් හිමියන් සමග සබැඳියාව

සමාගම උදෙසා කොටස් හිමියන්ගේ සැලකිය යුතු භූමිකාව අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරයෙන් හඳුනා ගෙන ඇත. සමාගම වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වයක් බලාපොරොත්තු වන අතර ඔවුනගේ යෝජනාද සාදරයෙන් පිළිගනියි.

ආයතනික සමාජයීය වගකීම

සමාගම සමාජය උදෙසා එහි වගකීම මැනවින් අවබෝධකර ගෙන ඇත. මේ සඳහා ආයතනයේ දායකත්වය මෙම වාර්ෂික වාර්තාවේ ආයතනික සමාජයීය වගකීම් යටතේ වෙනත් ස්ථානයක සඳහන්ව ඇත.

සේවක කරුණු සහ අදහස් හුවමාරුව

සේවකයින්ට ඕනෑම මොහොතක ඔවුන්ගේ දුක්ගැනවිලි හා ප්‍රශ්න කළමනාකාරිත්වයට ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත. කළමනාකාරිත්වය ඔවුන්ට සවන්දී එම අවස්ථාවේදීම විසඳුම් සපයයි.

පාරිසරික ආරක්ෂණය

පරිසර දූෂණයට බලපාන කිසිම කටයුත්තක් අප ආයතනය විසින් නොකරන අතර එවැනි දෙයක් සිදු නොවන ආකාරයේ උපරිම ක්‍රියාමාර්ග අනුගමනය කර ඇති බව දන්වන අතර සැමවිටම පරිසරය ආරක්ෂා කරන නීති පිළිපැදීමට බැඳී සිටී.

අඛණ්ඩ පැවැත්ම

සාධාරණ ලෙස දැකිය හැකි කාලයක් පුරාවට මෙහෙයුම් කටයුතු කරගෙන යෑම සඳහා සමාගම සතුව ප්‍රමාණවත් සම්පත් පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ. ඒ නිසා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම "අඛණ්ඩ පැවැත්ම" පදනම අනුගමනය කරයි.

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

වර්ෂ 2011 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව විගණනය කරන ලද ගිණුම් වාර්තා සහ එදිනට ශේෂ පත්‍රය අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේ ඉදිරිපත් කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි.

1. සමාගමේ ක්‍රියාකාරකම්

සමාගමේ ප්‍රමුඛතම ක්‍රියාකාරකම වනුයේ පුවත්පත් මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත්කිරීම හා පුවත්පත් සහ සඟරා බෙදාහැරීමත්ය. මේ සම්බන්ධයෙන් සුවිශේෂී වෙනස්කම් සමාලෝචිත වර්ෂය තුළදී සිදු නොවිනි.

2. මූල්‍ය ප්‍රකාශනයන්

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇත.

3. විගණකවරුන්ගේ වාර්තාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව වාර්ෂික වාර්තාවේ පිටු අංක 18 සිට 23 දක්වා ඇත.

4. වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

මූල්‍ය වාර්තා සකස් කිරීමේදී වාර්ෂික වාර්තාවේ සඳහන් සුවිශේෂී වූ ගිණුම් ප්‍රතිපත්ති අනුගමනය කර ඇත.

5. වාර්ෂික සමාලෝචනය

මූල්‍ය වර්ෂයට අදාළව සමාගමේ ක්‍රියාවලි සමාලෝචනය සහ එහි ප්‍රතිඵලය සභාපතිතුමාගේ සමාලෝචනය හා මූල්‍ය සමාලෝචනය තුළ ඇතුළත්වේ.

6. ආදායම

වර්ෂ 2011 දෙසැම්බර් මස 31 දිනට අවසන් වන වර්ෂය සඳහා සමාගම ලැබූ ආදායම රුපියල් මිලියන 3075 කි.

7. ලාභ සහ බෙදාහැරීම් (රුපියල් මිලියන)

	2011	2010
බදුවලට පෙරලාභ/(අලාභ)	14	(359.7)
බදු	(2.1)	(2.8)
විලම්බිත බදු	(22.9)	(25.0)
බදු අයකිරීමෙන් පසු ලාභ/(අලාභ)	(11.0)	(337.6)
පසුගිය වසරේ ඉදිරියට ගෙනා ලාභ/(අලාභ)	(172.8)	(-)
ලාභාංශ	-	-
ඉදිරියට ගෙන යා හැකි රඳවාගත් ලාභය	510.5	(172.8)

8. අයභාර සංචිත

2011 දෙසැම්බර් මස 31 දිනට සමාගමේ අයභාර සංචිත රුපියල් මිලියන 237.5 කි.

9. දේපළ පිරියත හා උපකරණ

2011 වර්ෂය තුළ සමාගම දේපළ පිරියත හා උපකරණ යන ප්‍රාග්ධන වියදම් සඳහා සහ නොනිම් ප්‍රාග්ධනය වෙනුවෙන් රු. මිලියන 67.8 ආයෝජනය කර ඇත. වර්ෂය තුල දේපළ, පිරියත හා උපකරණ වල වෙනස්වීම සටහන් අංක 07 යටතේ ඉදිරිපත් කර ඇත.

10. පරිත්‍යාග

සමාගම සමාලෝචන කාලය තුළ රු. 1,600,000.00 ක මුදලක් පුණ්‍යායතන සඳහා පරිත්‍යාග කොට ඇත.

11. කොටසක ශුද්ධ වත්කම

කොටසක ශුද්ධ වත්කම රුපියල් 78.17

12. කොටස් පිළිබඳ තොරතුරු

ලාභාංශ හා කොටසක ශුද්ධ වත්කම් වල ඉපයීමට අදාළ තොරතුරු සුවිශේෂී මූල්‍ය දත්තයන් හා දස අවුරුදු සාරාංශයන් යටතේ ඉදිරිපත් කර ඇත. කොටස් බෙදී ගොස් ඇති ආකාරය කොටස් පිළිබඳ තොරතුරු වාර්තාවේ ඇතුළත් වේ.

13. බහුතර කොටස් අයිතිය

ශ්‍රී ලංකා ජනරජය නියෝජනය වන අයුරින් 87.5% ක කොටස් බහුතරයක් මහා භාරකාරතුමා සතුව පවතී.

14. අධ්‍යක්ෂවරු

2011 දෙසැම්බර් 31 දිනට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඔවුන්ගේ කොටස් හිමිකම පහත දැක්වේ.

	කොටස් ප්‍රමාණය
බන්දුල පද්මකුමාර මහතා	-
සන්ද්‍රසේගරම් ෂන්මුගනාදන් මහතා	-
එදිරිසිංහ විතානගේ ප්‍රසාද් රසංග හරිස්චන්ද්‍ර මහතා	1
උපුල් රන්ජන් සමරසිංහ දිසානායක මහතා	-
සීලරත්න සෙනරත් මහතා	1

15. වර්ෂය තුළ ඉල්ලා අස්වීම් / අලුතින් පත් කිරීම්

වර්ෂය තුළදී ඉල්ලා අස්වීම් හා අලුතින් පත්කිරීම් සිදු කොට නැත.

16. අධ්‍යක්‍ෂවරුන්ට දුන් ණය

ආයතනය අධ්‍යක්‍ෂවරුන්ට ණය ලබාදී නොමැත.

17. අධ්‍යක්‍ෂවරු ගිවිසුම් සඳහා ඇති බැඳීම

2011 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්‍ෂවරු සෘජුව හෝ වක්‍රව ආයතනයේ ගිවිසුම් සඳහා අත්සන් කොට හෝ ඉදිරි කාලයට අදාළ ගිවිසුම් සඳහා හෝ බැඳී නැත.

18. අධ්‍යක්‍ෂවරුන්ගේ දීමනා

2011 වර්ෂයේදී අධ්‍යක්‍ෂවරුන්ගේ දීමනා සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2 යටතේ සඳහන් වේ.

19. ශේෂ පත්‍රය පිළියෙල කිරීමෙන් පසු සිදුවීම්

2011 දෙසැම්බර් 31 දිනට අවසන් වන වර්ෂය සඳහා ශේෂ පත්‍රය පිළියෙල කිරීමෙන් පසු ගිණුම් මගින් ගැලපුම් කිරීම සඳහා අවශ්‍යතාවයක් පැන නැගී නොමැත.

20. ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට හා සේවකයින්ට ගෙවන ලද සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට ගෙවා ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සෑහීමකට පත්වේ.

21. අඛණ්ඩ පැවැත්ම

ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රතිපාදන ඇති බවට අධ්‍යක්‍ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ. මේ හේතු නිසා මෙම ආයතනය මූල්‍යමය වාර්තා සැකසීමේදී “අඛණ්ඩ පැවැත්ම” පදනම අනුගමනය කරයි.

22. පාරිසරික ආරක්ෂණය

ආයතනය කිසිම අයුරකින් පරිසරය දූෂණය වන සහ පාරිසරික නීති පද්ධතියට අනුකූල නොවන කිසිම කටයුත්තකට සහභාගි නොවූ බවට අධ්‍යක්‍ෂ මණ්ඩලය ඔවුන්ගේ දැනුමේ හා විශ්වාසයේ හැටියට සෑහීමකට පත්වේ.

23. විගණකවරු

ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 (3) ජේදය අනුව විගණකාධිපති විසින් වර්ෂයේ ගිණුම් විගණනය කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි

කුමුදු එච්. ගුණවර්ධන ඉඹුලමුරේ

සමාගමේ ලේකම්.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ විස්තර පහත දක්වා ඇත. විගණන වාර්තාව මගින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ඔවුන්ගේ වගකීම පෙන්වා දී ඇත.

2007 අංක 07 දරන සමාගම් පනත අනුව අධ්‍යක්ෂවරුන් විසින් එක් එක් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතු අතර, එම ප්‍රකාශ ගිණුම් වර්ෂය අවසාන දිනට සමාගමේ තත්ත්වය සහ වර්ෂය තුළදී ලද ලාභය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු කළ යුතුය. මෙම ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධ්‍යක්ෂකවරුන් විසින් පහත සඳහන් කරුණු සහතික කළ යුතුය.

1. සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන නොවෙනස්ව අනුගමනය කර ඇති බවත්, යම් ප්‍රමාණාත්මක බැහැර වීමක් ඇතොත් ඒවා හෙළිදරව් කර විස්තර කර ඇති බව,

2. අදාළ ගිණුම් ප්‍රතිපත්ති සියල්ල අනුගමනය කර ඇති බව

3. තක්සේරු කිරීම් හා ගැළපීම් සාධාරණ සහ තහවුරු කළ හැකි බව

4. මූල්‍ය වාර්තා සමාගම් පනත සමග අනුකූල වන බව සනාථ කිරීමට සහ සමාගමේ මූල්‍ය තත්ත්වය ප්‍රමාණවත් නිරවද්‍යතාවයකින් හෙළිදරව් කිරීමට අවශ්‍ය ගිණුම් වාර්තා ආයතනය පවත්වාගෙන යන බව සහතික කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීමයි. එමෙන්ම සමාගමේ වත්කම් ආරක්ෂා කිරීමට සහ මනා අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් පියවර ගැනීමට අධ්‍යක්ෂවරු වගකිව යුතු අතර එමගින් වත්කම් වල ආරක්ෂාව සහ වංචා හා වැරදි වැළැක්වීම සහ සොයාගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතික විය හැක.

5. අධ්‍යක්ෂවරු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ වගකිව යුතු අතර විගණකවරුන්ට විගණන වාර්තාව සකස් කිරීමට අවශ්‍ය සියලුම පහසුකම් ලබාදීම, ඔවුන්ට අවශ්‍ය පරිදි පරීක්ෂා කිරීම් කටයුතු සැලසීම අධ්‍යක්ෂවරුන්ගෙන් සිදුවිය යුතුය.

මෙම වාර්තාවේ සඳහන් පරිදි අධ්‍යක්ෂවරුන්ගේ වගකීම ඔවුන් නොපිරිහෙලා ඉටුකර ඇති බව ඔවුන්ගේ අදහසයි.

ආයතනයේ විගණකවරුන් වන විගණකාධිපති තුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දෙන ලද මූල්‍ය ප්‍රකාශන සමග ගිණුම්කරණ වාර්තා, අදාළ තොරතුරු කොටස් හිමියන්ගේ සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පරීක්ෂා කර බලා ඔවුන්ගේ මතය මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති විගණන වාර්තාවේ ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,
කුමුදු එච්. ගුණවර්ධන ඉඹුලමුරේ
සමාගමේ ලේකම්.

සභාපති,
ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගමේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 28 දරන ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (විශේෂ විධි විධාන) පනතේ 16 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සමාගමේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සමාගමේ සභාපති වෙත 2012 ජූනි 08 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර් ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් භාවිතා කරනු ලබන මෝටර් වාහන, යන්ත්‍ර, පරිගණක සහ විදුලි සවිකිරීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 හි 30 වගන්තිය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගනු ලැබූ පරිගණකවල මුළු වාරික වටිනාකම වූ රු. 4,167,848 ක් ගෙවා නිම කර තිබූ නමුත් එය සින්නක්කර වත්කම්වලට මාරු කර නොතිබුණි.

(ආ) විදේශ ණයගැතියන් දැන්වීම් පළ කිරීම සඳහා කරන ලද තැන්පත්වලින් එකතුව රු. 1,522,392 ක ශේෂ වගකීම් යටතේ අත්තිකාරම් ලෙස පෙන්වනවා වෙනුවට වෙළඳ ණය ගැතියන්ට එරෙහිව හිලව් කර තිබුණි.

(ඇ) මුද්‍රණ වැඩ සඳහා සමාගමේ වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා යුද හමුදාව විසින් ගෙවන ලද රු. 1,331,868 ක අත්තිකාරම් මුදල වගකීම් යටතේ ගෙවිය යුතු අත්තිකාරමක් ලෙස පෙන්වනවා වෙනුවට ණය ගැතියන් යටතේ බැර ශේෂයක් ලෙස පෙන්වා තිබුණි.

(ඈ) වෙළඳ දැන්වීම් ණයගැතියන් තුළ අන්තර්ගතව තිබූ එකතුව රු. 19,863,773 ක බැර ශේෂ, වගකීම් යටතේ පෙන්වනවා වෙනුවට එම ගිණුමේ හර ශේෂයට එරෙහිව හිලව් කර තිබුණි.

(ඉ) විස්තරාත්මක ආදායම් වියදම් ගිණුමේ පෙන්වා ඇති වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ බාහිර වැඩවල පිරිවැය ගණනය කිරීමේදී, ලාභ ආන්තිකයද ඇතුළත් අභ්‍යන්තර වැඩවල ආදායම, එම දෙපාර්තමේන්තුවේ සමස්ත නිෂ්පාදන පිරිවැයෙන් අඩු කර තිබුණි.

(ඊ) රු. 300,000 ක් වූ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ කරන ලද ආයෝජනය අනුචිත ලෙස ලැයිස්තුගත නොවන සමාගම් ආයෝජන යටතේ වර්ග කර තිබුණි.

(උ) ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම 2008 වර්ෂයේදී එකක් රු. 1,000 බැගින් වූ කොටස් 2,400 ක් මිලදී ගැනීම සඳහා ලංකා පුවත් සමාගමට රු. මිලියන 1.2 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. එකී මුදල මූල්‍ය ප්‍රකාශවල ආයෝජන යටතේ පෙන්වනු වෙනුවට අත්තිකාරමක් ලෙස පෙන්වා තිබුණි.

(ඌ) 1999 වර්ෂයට අදාළ රු. 8,652,936 ක්වූ මාර්ගස්ථ භාණ්ඩ වටිනාකම, අවශ්‍ය ගැලපීම් සිදු කිරීමෙන් තොරව දිගින් දිගටම විවිධ ණයගැතියන් යටතේ පෙන්වා තිබුණි.

(එ) "ගොස් මැග්නම් ෆෝ එක්ස්පැන්" යන්ත්‍රයට 2011 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ රු. 2,364,780 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි. ඒ හේතුවෙන් වත්කම් හා වගකීම් ගිණුම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ඒ) සමාගමේ නමට තිබූ ස්ථාවර තැන්පතු 2 ක එකතු වටිනාකම රු. 309,627 ක් මූල්‍ය ප්‍රකාශවල දක්වා නොතිබුණි.

2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව දායක මුදල් ණයගැති ගිණුමේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 15,861,472 ක් විය. විස්තරාත්මක උපලේඛන අනුව එකී ශේෂය රු. 11,110.942 ක් විය. ඒ අනුව වෙනස රු. 4,750,530 ක් වූ අතර එය සසඳා නොතිබුණි.

2.2.4 හඳුනා නොගත් වෙනස් කම්

"ඇඩ්ප්‍රෝ" පද්ධතිය මගින් ගිණුම්ගත කරන ලද දෛනික ලැබීම් සහ බැංකුවේ තැන්පත් කරන ලද මුදල් අතර රු. 85,020 ක අතිරික්තයක් හා රු. 137,854 ක ඌනතාවක් නිරීක්ෂණය විය. එම වටිනාකම 2011 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි නිරවුල් කිරීමට පියවර ගැනීමකින් තොරව පිළිවෙලින් හිඟ බැර හා හර ලෙස පෙන්වා තිබුණි.

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා ගෙවූ එකතුව රු. 2,105,423 ක්වූ අත්තිකාරම්, වර්ෂ 01 සිට 7 දක්වා කාල පරාසයක් තුළ හිඟව පැවතුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට පුවත්පත් නියෝජිත ණයගැතියන් තුළ ඇතුලත් අත්හිටවූ ණයගැති මුදල රු. 2,631,559 ක් විය.

(ඇ) පුවත්පත් නියෝජිත ණයගැතියන් තුළ ඇතුලත් ඉවත් කළ ණයගැතියන් වටිනාකම 2011 දෙසැම්බර් 31 දිනට රු. 9,661,338 ක් විය. එකී ණය ගැතියන්ගෙන් රු. 5,324,376 ක් හෙවත් 55% ක් ශේෂයක් වර්ෂයකට පෙර ඉවත් කළ ණය ගැතියන්ය. මේ සම්බන්ධයෙන් සමාගම නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තු ණයගැතියන් යටතේ පෙන්වා තිබූ රු. 654,758 ක මුදලක් වර්ෂ 2 ට වඩා හිඟව පැවතුණි. එම මුදල තුළ ඇතුලත් චලනය නොවන ශේෂය රු. 135,735 ක් විය.

(ඉ) ශේෂය රු. 50,000 ට වැඩි ණයගැතියන්ට අදාළව එකතුව රු. 515,777,384 ක් වූ වෙළඳ ණයගැතියන්ට සනාථ කිරීම් ලිපි යවා තිබුණි. එයින් රු. 20,884,706 ක් වටිනා ණය ගැතියන් සම්පූර්ණයෙන් එකඟතාව පල කර තිබුණි. රු. 6,738,388 ක් වටිනා ශේෂ සමග එකග වී නොතිබුණ අතර 2012 ජුනි 29 දින දක්වා රු. 488,154,290 ක් වටිනා ශේෂ සනාථ කිරීම් ලැබී නොතිබුණි.

(ඊ) වෙළඳ දැන්වීම් සඳහා ණය කාලය දින 50 ක් වුවත් ශුද්ධ වෙළඳ දැන්වීම් ණයගැතියන්ගෙන් 4% ක් වර්ෂ 1 ට වැඩි ණය ශේෂයන් විය. රු. 2,580,486 ක මුදලක් රජයේ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ ණය ගැතියන් විය. තවද දින 720 කට වැඩි රජයේ හා පෞද්ගලික අංශයේ ණය ගැති ශේෂවලඑකතුව රු. 5,421,207 ක් විය.

(උ) විවිධ ණය හිමියන් ශේෂය තුළ 2008 වර්ෂයට අදාළ රු. 982,363 ක හඳුනා නොගත් තැන්පතුවක් ඇතුලත් වී තිබුණි. එය හඳුනා නොගෙන ගිණුම්වල ගැලපීම් නොකර ණය හිමියන් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඌ) සමාගමකට ණය පදනම මත ප්‍රදානය කරන ලද මුද්‍රණ කඩදාසි සඳහා 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු . 20,472,394 ක මුදල, වර්ෂ 2 කට වඩා හිඟව පැවතුණි.

(එ) මුද්‍රණ කඩදාසි කිලෝ ග්‍රෑම් 199,798 ක් භාණ්ඩ හුවමාරු කර ගැනීමේ පදනම යටතේ 2010 ජනවාරි හා පෙබරවාරි මාසවලදී ලක්බිම සමාගමට ලබාදී තිබුණි. එහෙත් 2011 දෙසැම්බර් 31 දින දක්වා එයින් කිලෝ ග්‍රෑම් 104,388 ක් පමණක් ආපසු ලැබී තිබුණි. ඒ අනුව රු. 6,821,487 ක් වටිනා මුද්‍රණ කඩදාසි කි.ග්‍රෑ. 95,410 ක් 2012 ජුනි 29 දින වන විටත් ආපසු ලැබී නොතිබුණි.

(ඒ) රු. 18,343,239 ක් වටිනා අගරු චෙක්පත් 130 ක් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. එයින් රු. 1,814,872 ක් වටිනා චෙක්පත් 67 ක් වර්ෂ 1 ට වඩා හිගව පැවතුණි.

2.2.6 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

භෞතික සත්‍යෙක්ෂණ වාර්තා නොමැතිවීම හේතු කොටගෙන රු. 6,374,634 ක් වටිනා මෝටර් වාහන 7 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරික්ෂා කළ නොහැකි විය.

2.2.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

	නීති, රීති ගෙලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම
(අ)	1971 අංක 38 දරන මුදල් පනත	
(i)	13 (8) වගන්තිය	2010 වර්ෂය සඳහා මුදල් පනතේ 13 (7)(ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කළ වාර්තාවෙහන් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග හා ගෙන ඇති ක්‍රියා මාර්ග සඳහන් කරමින් සමාගම විසින් පිළිතුරක් එවා නොතිබුණි.

(ii) 14(1) වගන්තිය — සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් මූල්‍ය ප්‍රකාශන සමග විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 13 (5) (ඕ) වගන්තිය — අර්ධ වාර්ෂික අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114 (1) වගන්තිය සහ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 ඡේදය — බෝනස් ගෙවීම්වලට අදාළ උපයන විට ගෙවීමේ බදු සේවකයින්ගේ වැටුපින් අඩු නොකොට සමාගම විසින් ගෙවා තිබුණි. 2010/2011 වර්ෂය සඳහා එසේ ගෙවූ මුදල රු. 12,481,683 කි.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 9.2 (ආ) සහ (ඈ) වගන්තිය — සංවිධාන සටහනට සහ අනුමත කාර්ය මණ්ඩලයට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු නමුත් එසේ ලබාගෙන නොතිබුණි.

(ii) 9.2 (ආ) වගන්තිය — සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය සංයුක්ත සැලැස්මේ ඇතුළත් කළ යුතු නමුත් 2006 ජූලි 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 2006 සිට 2015 දක්වා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට ඇතුලත් කර තිබුණි.

2.2.8 මතභේදයට තුඩු දෙන විෂයයන්.

අදාළ ආයතන හෝ පුද්ගලයින්ගේ විධිමත්ව ඇණවුම් ලබාගැනීමකින් තොරව රු. 15,054,600 ක් වටිනා මුද්‍රණ වැඩ 10 ක් වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ කර තිබුණි. තවද එම වැඩ වලින් රු. 6,074,600 ක් වටිනා වැඩ සඳහා ගාස්තු අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. වෙනත් වැඩ විෂයයන් තුනකට අදාළ රු.7,980,000 ක මුදලක් කිසිදු පදනමක් නොමැතිව විකුණුම් ප්‍රවර්ධනය ගිණුමට එරෙහිව කපා හැර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ බදු පූර්ව ශුද්ධ ලාභය රු. 14,036,475 ක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂය සඳහා බදු පූර්ව ශුද්ධ පාඩුව රු. 359,781,998 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 373,818,473 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. වියදම් රු. 228,489,987 කින් අඩුවීම හා ආදායම රු. 145,328,486 කින් වැඩිවීම සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ සමාගමේ දළ ලාභ ආන්තිකය හා ලාභ අධිකය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී පිළිවෙලින් 1.95% කින් හා 7.63% කින් වැඩි වීමක් විය. ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමයෙහි පිරිවැය රු. මිලියන 176 කින් අඩු විය. ඒ හේතුවෙන් ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ පාඩුව සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 14 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් බවට පරිවර්තනය විය. මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනයේදී අනාවරණය වූ ඇතැම් කරුණු ඉකුත් වර්ෂය හා සසඳා පහත දැක්වේ.

	2011	2010
	%	%
දළ ලාභ ආන්තිකය	50.42	48.47
ලාභ අධිකය (විකුණුම් පිරිවැය මත දළ ලාභය)	101.69	94.06
පිරිවැටුම මත පරිපාලන පිරිවැය	40.00	45.19
පිරිවැටුම මත විකුණුම් හා බෙදාහැරීම් පිරිවැය	10.14	10.95
පිරිවැටුම මත මූල්‍ය පිරිවැය	3.63	2.42
ජංගම අනුපාතය	1.4:1.00	1.46:1.00
ද්‍රවශීල අනුපාතය	0.95:1.00	1.04:1.00

4. මෙහෙයුම් සමාලෝචනය

4.1.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගම සමාලෝචිත වර්ෂයේදී පුවත්පත් 6 ක්, වාර සඟරා 12 ක් සහ වාර්ෂික ප්‍රකාශන 2 ක් ප්‍රසිද්ධ කළ අතර ඉකුත් වර්ෂයේදී පුවත්පත් 6 ක්, වාර සඟරා 7 ක් සහ වාර්ෂික ප්‍රකාශන 11 ක් ප්‍රසිද්ධ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පුවත්පත්, වාර සඟරා සහ වාර්ෂික ප්‍රකාශනවල ශුද්ධ දායකය රු. 179,311,948 කින් වැඩි වී තිබුණි.

(ආ) සමාගම පළකළ පුවත්පත් 6 න්, මූල්‍ය ප්‍රතිඵලවලට වාසිදායක දායකත්වයක් ලබා දී තිබුණි. විස්තර පහත පරිදි වේ.

(i) සමාගමේ සමස්ථ වෙළඳ දැන්වීම් ආදායම, ඉකුත් වර්ෂය හා සැසඳීමේදී රු. 253,503,962 කින් හෙවත් 12.7 කින් වැඩි වූ අතර 2011 ඔක්තෝබර් 01 දින සිට වෙළඳ දැන්වීම් ගාස්තු 31.5% කින් ඉහළ දමා තිබුණි.

(ii) සමාගමේ සමස්ථ පුවත්පත් විකුණුම් ආදායම, පසුගිය වර්ෂයේ රු. 474,808.907 සිට සමාලෝචිත වර්ෂයේදී රු. 496,505,606 ක් අදවා 4.57% කින් වැඩි වූ අතර සමාලෝචිත වර්ෂයේදී පුවත්පත් 3 ක මිල ගණන් 25% කින් ඉහළ දමා තිබුණි.

(iii) ඉකුත් වර්ෂය හා සැසදීමේදී වෙළඳ දැන්වීම් ආදායම සහ පුවත්පත් විකුණුම් ආදායම අඩුවීම හේතුවෙන් සිළුමිණ පුවත්පතේ ශුද්ධ දායකය රු. 34,731.985 කින් අඩුවී තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ නිලධාරියෙකුට වියලි ආධාර වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. 250,000 ක අත්තිකාරමක් 2004 සැප්තැම්බර් මාසයේදී ලබාදී තිබුණි. කෙසේ වෙතත් එකී නිලධාරියා දැනටමත් සේවයේ යෙදී සිටියදී මෙම අත්තිකාරම නිරවුල් කර නොතිබුණි.

(ආ) සීමාසහිත ලේක්හවුස් දේපල සංවර්ධන සමාගමේ 1985 වර්ෂයේදී ආයෝජනය කර තිබූ රු. 7,500,000 සඳහා සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2011 ක්‍රියාකාරී සැලැස්මට අනුව, වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වන්නේ ආදායම ඉහළ දැමීම වන අතර බාහිර ආදායම 55% ක් ඉපැයීමට හා අභ්‍යන්තර ආදායම 45% ක් ඉපැයීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම තථ්‍ය ආදායම සමග සැසඳීමේදී මුළු අයවැය ගත ආදායමින් 71% ක් පමණක් සාක්ෂාත් කරගෙන තිබූ බවත්, අභ්‍යන්තර ආදායමින් 70% ක් හා බාහිර ආදායමින් 30% ක් උපයා තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව සමාගම බාහිර ආදායම් ඉලක්කයන් සපුරාගෙන නොතිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාවිතා කළ නොහැකි මෝටර් වාහන 7 ක් අපහරණය කිරීමට තීරණය කර තිබුණු අතර එයින් වාහන 3 ක් පමණක් අපහරණය කර තිබුණි. ඉතිරි වාහන 4 භාවිතා කළ නොහැකි වත්කම් ලෙස 2011 දෙසැම්බර් 31 දිනට පැවැතුණි. මෙම වාහනවල පිරිවැය රු. 3,737,812 ක් විය.

(ආ) භාවිතා කළ නොහැකි රු. 71,991 ක් වටිනා අභ්‍යාස පොත් තොගයක් මහනුවර ශාඛා කාර්යාලයේ පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) කැමරා සහ වෙනත් උපකරණ විෂයයන් 147 ක් අපහරණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව ඡායාරූප සේවා දෙපාර්තමේන්තුවේ පැවතුණි. එකී උපකරණවල වටිනාකම විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

4.5 ආර්ථික නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට රු. 203,421,900 ක් වටිනා පෙළ පොත් 24 ක් මුද්‍රණය කිරීමේදී ඒවා සැපයීම ප්‍රමාද වීම සහ ගුණාත්මක භාවය අඩුවීම හේතුකොටගෙන, සමාලෝචිත වර්ෂය තුළදී

රු.1,070,242 ක් දඩ මුදලක් ලෙස ගෙවා තිබුණි. පසුගිය වර්ෂවලදී ගෙවා ඇති මෙවැනි දඩ මුදල් ප්‍රමාණය රු.4,799,532 ක් විය.

(ආ) බෙදාහැරීමේ අංශය විසින් බෙදා හරින ලද පුවත්පත්වලින් විශේෂ හා පොදු හේතු මත ආපසු එවීම් සමාගම විසින් ආපසු භාරගනු ලැබේ. ඊට අමතරව නියෝජිතවරුන්ට වෙළඳ ප්‍රවර්ධන සඳහා බෙදාහල අතිරික්ත පුවත්පත් කිසිදු සීමාවකින් තොරව ආපසු භාරගනී. 2011 ජනවාරි සිට මැයි දක්වා වූ පුවත්පත් නියෝජිත විශේෂ ආපසු වීම් නිවේදන සාරාංශය පිළිබඳව කරන ලද සෝදිසි පරීක්ෂණයකදී ආපසු එවා තිබූ පුවත්පත් වලින් 90% ක්ම වෙළඳ ප්‍රවර්ධන කාර්යය සඳහා වැඩිපුර යැවූ පුවත්පත් බව අනාවරණය විය.

4.6 මුදල් කළමනාකරණය

සමාගම විසින් 2011 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි දැක්වූ ගැලපුම් විග්‍රහයට අනුව, මාස 6 කට වැඩි කාලයක් තුළ ගැලපුම් නොකළ හඳුනා නොගත් හර හා බැර ශේෂයන් පිළිවෙලින් රු. 1,822,226 ක් හා රු. 803,287 ක් විය.

4.7 හදුනා ගන්නා ලදු පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් එක් පුවත්පතකට හා වාර සඟරාවකට පිළියෙල කරන ලද මුද්‍රණ ඇණවුම්වල ප්‍රමාණය ඉක්මවා සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී පුවත්පත් සහ වාර සඟරා පිටපත් 2,506,449 ක් මුද්‍රණය කර තිබුණි. තවද, ප්‍රකාශන මුද්‍රණයේදී සමාගම විසින් අපතේ යන ප්‍රමාණය සඳහා ඉඩ දී ඇති ප්‍රමාණය හොඳ තත්ත්වයේ පුවත්පත් වලින් 5% ක් විය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුලදී හොඳ තත්ත්වයේ පුවත්පත් සහ අපතේ ගිය පුවත්පත් සැසඳීමේදී, එසේ ඉඩදුන් ප්‍රතිශතය සමහර අවස්ථාවලදී ඉක්මවා ගොස් ඇති බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුලදී පුවත්පත් සහ වාර සඟරාවල හොඳ පිටපත් බෙදාහැරීමෙන් පසු සමාගමේ ඉතිරි වූ පිටපත් ප්‍රමාණය 858,813 ක් විය. මේවාහි පිරිවැය ආසන්න වශයෙන් රු. 18,403,595 ක් විය.

(ආ) ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් අයවිය යුතු ලෙස පෙන්වා තිබූ රු. 5,432,000 ක මුදල සමාලෝචිත වර්ෂය තුළදී වියදමක් ලෙස, කිසිදු පදනමකින් තොරව විකුණුම් ප්‍රවර්ධන ගිණුමට මාරුකර තිබුණි.

4.8 සමාගමේ සම්පත් වෙනත් පාර්ශ්වයන් විසින් උපයෝජනය කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව සමාගමේ නිලධාරීන් 5 දෙනෙකු බාහිර ආයතනවලට මුදාහැර තිබුණි. ඔවුන්ගේ වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී සමාගම රු. 1,103,112 ක් වැය කර තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2010 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව සමාගම විසින් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) අත්තිකාරම් පියවීම
(ආ) ශාඛාවල මූල්‍ය පාලනය
(ඇ) වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වැඩ ලේඛන පවත්වාගෙන යාම.

එච්. ඒ. එස්. සමරවීර
විගණකාධිපති.

2.2 ගිණුම් සඳහා පිළිතුරු ප්‍රකාශ

2.2.1 ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත

අපි මෙම මතයට එකඟ නොවෙමු. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 18 අනුව සංවිධානයකට මූල්‍ය ප්‍රකාශනයේ වත්කම් පසුකාලීනව හඳුනාගැනීම සඳහා පිරිවැය ආකෘතිය හෝ ප්‍රත්‍යාගණන ආකෘතිය යන දෙකින් එකක් භාවිතා කළ හැක. සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම පිරිවැය ආකෘතිය භාවිතා කරන බව පැහැදිලිවම ගිණුම් සඳහා සටහන් යටතේ අනාවරණය කොට ඇත.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

අ) පිළිගනිමි, අපි මෙම පරිගණක වැරදීමකින් සින්නක්කර වත්කම් වෙනුවට කල් බදු වත්කම් යටතේ සඳහන් කර ඇති මෙය 2012 දී නිවැරදි කරමි.

ආ) මෙම ඉදිරිපත්කිරීමේ වැරැද්ද 2012 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

ඇ) මෙම ඉදිරිපත්කිරීමේ වැරැද්ද 2012 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

ඈ) එය නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.

ඉ) වාණිජ මුද්‍රණ අංශය වෙන වෙනම වැඩපත් අභ්‍යන්තර සහ බාහිර වැඩ සඳහා නඩත්තු කරයි. උපලේඛන අංක 11 හි විස්තරාත්මක ආදායම් සහ වියදම් ගිණුමේ වානිජ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ බාහිර හා අභ්‍යන්තර ආදායම් සහ ඊට අනුරූප විකුණුම් වියදම් පැහැදිලිවම දක්වා ඇත.

ඊ) මෙම වර්ගීකරන වැරැද්ද ලබන වසරේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරනු ලැබේ.

උ) රුපියල් මිලියන 1.2 ක අත්තිකාරම් ගෙවීම ලංකා පුවත් සමාගමේ කොටස් 2400 අත්පත්කරගැනීම සඳහා වැයකර ඇත. මෙය අනෙකුත් මාධ්‍ය ආයතන ආකාරයට වගේම වෙබ් ප්‍රකාශන මාධ්‍යයය වල ව්‍යවසාය හිමිකම අත්පත්කරගැනීමටය. නුදුරු අනාගතයෙදීම ශේෂය ගෙවා අදාල කොටස් සහතික ලබාගැනීමට පියවර ගනු ලැබේ.

ඌ) මෙම විවිධ ණය ගැති ශේෂයයන් පැන නැග ඇත්තේ වැරදි ගිණුම් තැබීම නිසාය. මෙය 2012 දී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා පොත්වලින් ලියාහැර ඇත.

එ) මෙය 2012 ගිණුම් වලින් නිවැරදි කරනු ලැබේ.

ඒ) මෙම ස්ථාවර තැන්පතු 2 ක අලිමංකඩදී රට වෙනුවෙන් දිවි පිදූ සෙබළුන්ගේ දෙමව්පියන්ගේ හිත සුව පිණිස ආරම්භකළ "හසලක වීර සෙබල අරමුදල" ට අයත්වන අතර සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට අයත් නොවේ.

2.2.3 නොසැසඳු පාලන ගිණුම්

වෙනස, හඳුන්වාදුන් පරිගණක වැඩ සටහන නිසා බව නිරීක්ෂණය විය. නව වැඩසටහන සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වූ විට මෙය නිවැරදි කරනු ලැබේ.

2.2.4 හඳුනා නොගත් වෙනස් කම්

හඳුනා නොගත් හර හා බැර ශේෂයන් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

අ) විගණන විමසීමට පසුකාලීනව අත්තිකාරම් කිහිපයක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව අයකරගැනීම, පියවා ගැනීම සහ ලියාහැරීම සිදුවිය. දැනට නොපියවූ ශේෂයන් රු. 782,567/92 පෙන්වන්නේ 2005 සිට 2008 දක්වා වූ මිලදී ගැනීමය. එය 2012 දී නිවැරදිව ගිණුම්ගත කරනු ලැබේ.

ආ) මෙම රු. 2,631,559/- නිසි ලෙස පත්කරන ලද ස්ථිර පුවත්පත් ඒජන්තකරුවන්ගේ අක්‍රමික පියවීම් නිසා නොපියවූ සති 7 සැපයුම්වල වටිනාකමින් යුතු

ඇප තැන්පත් ය. අප මෙම පාර්ශවයන්ගේ ඒජන්සි තාවකාලිකව නතරකර ඇත. ඔවුන් මෙම හිඟ ශේෂයන් සම්පූර්ණයෙන් පිය වූ විට නැවත වෙළඳ කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

ඇ) අපි මෙම ඒජන්තවරුන්ගේ අවසන් ගිණුම් සම්පූර්ණ කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටිමු. එමෙන්ම ඔවුන්ගේ තැන්පත්වලට වඩා වැඩි ඕනෑම ශේෂයකට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ගයන් ගැනීමට බලාපොරොත්තුවෙමු.

ඈ) ණයගැතියන් 12 දෙනෙකුගෙන් අවුරුදු 2 තුළ අයකර ගැනීමට නොහැකි වූ රු. 135,735/- 2012 දී පොත්වලින් ලියාහැරීමට කටයුතු කරනු ලැබේ.

ඉ) විගණන නිලධාරීන් සමග එකඟවූ පරිදි සී/ස එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම රු. 50,000 ට වැඩි ණය ගැතියන්ට ශේෂය තහවුරු කිරීමේ ලිපි යවා ඇත. කෙසේවුවත් ණයගැතියන් කිහිපදෙනෙක් පමණක් ප්‍රතිචාර දක්වා ඇති අතර මෙම තත්ත්වය අපට පාලනය කළ නොහැක. ණය ගැතියන් 28 දෙනෙකු මෙම ශේෂයන් හා එකඟවූ අතර මෙම වෙනස්වීම් බෙහෙවින්ම නාමමාත්‍රය.

ඊ) සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම. පෞද්ගලික අංශයේ මුද්‍රිත මාධ්‍ය සමාගම් රැසක් ඇති පුවත්පත් මුද්‍රණ කර්මාන්තයේ ඉතා ඉහළ තරඟකාරීත්වයක් තුළ රජය සහ පෞද්ගලික අංශයේ සංවිධාන සමග සමීප ව්‍යාපාර සබඳතා පවත්වාගෙන යයි. දැඩි තරගකාරීත්වය මධ්‍යයේ සමාගමට වෙළඳපල දිනාගැනීමේ දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුව ඇත. තරගකරුවන්ට මුහුණ දීමට සහ ව්‍යපාරය ආරක්ෂාකර ගැනීමට අවශ්‍ය ව්‍යාපාරික කටයුතු ඉතා සියුම්ව සහ ප්‍රායෝගික ආකාරයට මෙහෙයවීමට සමාගම එකතු කිරීම් පිළිබඳව සෝදිසියෙන් සිටින අතර අවදානම් ආවරණය කිරීමට බුද්ධිමත්ව කටයුතු කරයි. බොහෝ අවස්ථාවන් වලදී ණය කාලසීමාවන් ඉක්මවා ණය පහසුකම් සැපයීම නොවැලැක්විය හැකියි. කෙසේ වෙතත් ණය අයකර ගැනීමට සමාගමට පාඩුවක් නොවන අයුරින් නියමිත පරිදි හා ප්‍රායෝගික අයුරින් සිදුව ඇත. තවද භාණ්ඩාගාර ප්‍රතිපාදන වල ප්‍රතිඵලයක් වශයෙන් රජයේ ගණුදෙනු පියවීම් බොහෝවිට ප්‍රමාද වන බව සමාගම අවබෝධකරගෙන ඇත.

රජයේ සහ පෞද්ගලික අංශයේ ගණුදෙනුකරුවන්ගේ නොපියවූ ණය අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාගී ආරම්භකර ඇත.

උ) 2008 දැන්වීම් සඳහා ලැබූ රු. 982363/- ක විදේශ ප්‍රේෂණ, ප්‍රේෂණ ලිපිවල ඇති අසම්පූර්ණ වාර්තා නිසා හඳුනාගැනීමට නොහැක. අප මෙය නිරාකරනය කරනතෙක් විවිධ ණය හිමියන්ගේ ගිණුමේ තබාගන්තෙමු. පසුගිය අවුරුදු 3 තුළම මේ සඳහා හිමිකම් ඉදිරිපත් නොවූ බැවින් 2012 දී විවිධ ආදායම් ලෙස පිළිගනු ලැබේ.

ඌ) පුවත්පත් මුද්‍රණ කර්මාන්තය තුළ මුද්‍රණ කඩදාසි, මුද්‍රණ තහඩු සහ ඇතිරිලි වැනි ආනයනික අමුද්‍රව්‍ය කිහිපයක් සපයන මාර්ග බෙහෙවින්ම සීමාසහිතය, පොරොත්තු කාලය ද බෙහෙවින් දීර්ඝය, පුවත්පත් සමාගම් එවැනි දෑ හදිසියේ සපයා ගැනීමේ දී ඔවුනොවුන් සමග සමීප වෙළඳ සබඳතා පවත්වා ගනිති. ඒ අනුව අප රිවිර මීඩියා සමාගමට රු. මිලියන 116.6 වටිනා පුවත්පත් මුද්‍රණ කඩදාසි රු. මිලියන 16.7 ලාභයකට අත්පිට මුදලට / ණයට සපයන ලදි. මෙම මුදලින් 2011 දෙසැම්බර් 31 දින වන විට රු. 20,472.394/- ආපසු ලැබිය යුතුව ඇත.

මෙය අනාගතයේදී ගෙවා නිදහස් කරනු ඇතැයි අප බලාපොරොත්තු වෙමු.

එ) මේ අයුරින්ම අපි ලක්බිම පුවත්පත් සමාගමට පුවත්පත් කඩදාසි සපයා එයට ණය

වශයෙන් 2011 දෙසැම්බර් 31 දිනට රු. 6821,487/- මුදලක් ලැබිය යුතුව ඇත. එම ශේෂය අයකරගැනීමට මේ වන විට නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

ඒ) මුළු මුදලින් රු. 1,814,872 වටිනාකමින් යුතු චෙක්පත් 63 ක් අවුරුද්දක කාලයක සිට නොපියවී පවතී. අපි මෙම නොපියවූ ණය අයකරගැනීමට කටයුතු යොදමින් සිටින්නෙමු. එය ඉටුනොවුනහොත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වෙමු.

2.2.6. විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

මෙම සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පහතින් විස්තරවන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වාහන 7 ක වටිනාකම රු.7/- කි.

වාහන අංකය	මිලදී ගත් වර්ෂය	පිරිවැය	ක්ෂය	ඉදිරියට ගෙනා වටිනාකම
48-7374	1996 ඔක්.	රු. 175,000.00	රු. 174,999.00	1.00
48-9549	1997 මාර්තු	රු. 1,163,000.00	රු. 1,162,999.00	1.00
50-2904	1986 සැප්.	රු. 265,500.00	රු. 265,499.00	1.00
87-8848	1983 ඔක්.	රු. 33,850.00	රු. 33,849.00	1.00
300-8895	1998 නොවැ.	රු. 1,975,000.00	රු. 1,974,999.00	1.00
WP-HJ-3824	2003 සැප්.	රු. 2,495,834.00	රු. 2,495,833.00	1.00
14-7469	1987 පෙබ.	රු. 266,450.00	රු. 266,449.00	1.00

වාහන අංක 300 - 8895 සහ HJ-3824 තවමත් අප වාහන පද්ධතියට අයත්ව ඇත. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ භෞතික සත්‍යාපන වාර්තාවට යොමුවනවා වෙනුවට සෘජු විමසා බැලීමක් කරන්න. අනෙකුත් වාහන පසුගිය වසරවල ඉවත්කර ඇත. නමුත් මූල්‍ය අංශයට නිශ්චිත දැනුම්දීමක් කර නොමැති බැවින් දැනටත් මූල්‍ය ප්‍රකාශනවල සඳහන්ව ඇත. මෙය 2012 ගිණුම් වල නිවැරදි කරනු ලැබේ.

2.2.7 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

අ) I. 2010 වාර්තාවේ 13(7) (a) ඡේදයට අපිට ප්‍රතිචාර දැක්වීමට නොහැකි වුවත් 14(2) (c) අවසන් වාර්තාවේ සඳහන් සාරාංශගත 13(7) (a) සඳහා සඳහන් කළ කාල පරිච්ඡේදය තුළ ප්‍රතිචාර දක්වා ඇත.

II. 2011 වාර්ෂික වාර්තා කෙටුම්පතේ පිටපතක් හැකි ඉක්මණින් ඉදිරිපත් කරමි.

III. මෙය අනාගතයේදී ඉටුකරනු ලැබේ.

ආ) සමාගම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පනතට අනුකූලව කටයුතුකරමින් නියමිත දිනයන්හි ගෙවීම්කර ඇත. කෙසේවෙතත් ප්‍රසාද දීමනා සඳහා ගෙවන උපයනවිට ගෙවීම් බද්ද, සේවකයින් වෙනුවෙන් ගෙවීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබේ.

ඇ) I. මෙය අනාගතයේදී ඉටුකරනු ලැබේ.

II. පිළිගනිමි

2.2.8 මතභේදයට තුඩුදෙන විෂයයන්

වාණිජ මුද්‍රණ අංශයේ විශේෂිත රජයේ සමාගමක් වීම නිසා රජයේ ආයතන සහ සංවිධාන සමහර වාණිජ මුද්‍රණ කටයුතු කඩිනමින් ඉටුකර ගැනීමට අප වෙත යොමුකරති. මේ වනතුරු අයකර ගැනීමට නොහැකි වූ එවැනි වැඩ විගණන වාර්තාවේ මුද්‍රණ වැඩ වශයෙන් සඳහන්ව ඇත. මෙම මුදලින් රු. 7980,000 අයකරගත නොහැකි ලෙස ලියා හැර ඇත.

3. මූල්‍ය සමාලෝචනය

3.1 පිළිගතිමි

3.2 පිළිගතිමි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

ආ) පිළිගතිමි

ආ) I. පුවත්පත් 18 කින් උපදවන මුළු දැන්වීම් ආදායම රු. 259,601.516/- කින් වැඩිවී ඇත. මෙය 2010 ට වඩා 13% ක වර්ධනයකි. ප්‍රකාශන 18 න් ප්‍රකාශන 2 ක පමනක් වසර මැද දී 15% කින් පමණ දැන්වීම් මිල වැඩිකරන ලදී. මෙම ප්‍රතිශෝධිත පුවත්පත් දෙකේ දැන්වීම් අදායමේ පරිමාව සිතා බැලීමේදී මුළු දැන්වීම් ආදායම් ප්‍රතිඵලය ආන්තික වේ.

II. පුවත්පත් 18 කින් උපයන සම්පූර්ණ පුවත්පත් විකුණුම් ආදායම රු. 592,496,356/- සිට පවත්නා වර්ෂයට රු. 674,994,020 ලෙස රු. 82,497,664/- කින් 14% ක වර්ධනය විය. මුළු ප්‍රකාශන 18 න් 9 ක වසර මැද මිල වැඩිකරන ලදී.

III. පිළිගතිමි

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

අ) අපි මෙය පරීක්ෂාකරමින් පසුවෙමු. 2012 දී මේ පිළිබඳ නිවැරදි ක්‍රියාමාර්ගයට බලාපොරොත්තු වෙමු.

ආ) මෙය තවමත් වැඩ ආරම්භ නොකළ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට සම්පූර්ණයෙන් අයිතිය ඇති උපසමාගමකි. එබැවින් අද දක්වා ලාභාංශ ගෙවා නැත. කෙසේ වෙතත් ලේක්හවුස් දේපල සංවර්ධන, පෞද්ගලික සමාගම හෝකන්දරින් අක්කර 8 ක ඉඩමක් ශක්තිමත් ප්‍රාග්ධන ලාභ වැයකර මිලදී ගෙන ඇත. එමෙන්ම රුපියල් මිලියන 9.6 ක ආයෝජනයක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇත.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

ක්‍රියාකාරී සැලසුම් හා අයවැය පුරෝකථනයන් සැලසුම් කිරීමේ දී වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුව යටතේ 2011 සඳහා රජයේ පෙළ පොත් මුද්‍රණයෙන් රුපියල් මිලියන 200 බාහිර ආදායමක් අපි බලාපොරොත්තු වුනෙමු. කෙසේ වෙතත් අපගේ මිල අඩුම මිල නොවීම නිසා මෙය ටෙන්ඩරයේ සෑහෙන තරම් කොටසක් රැගෙන ඒමට අපට නොහැකිවිය. අපිට මෙම ටෙන්ඩරය නිසි පරිදි ලැබිණි නම් මෙම අනුපාතය බාහිර 53% අභ්‍යන්තර 47% ලෙස වෙනස්වීමට ඉඩ තිබුනි.

4.4 වත්කම් කළමනාකරණය

අ) මෙම වාහන 7 විකිණීමට මහජන ටෙන්ඩරයක් කැඳවා තිබුනි. නමුත් ඉහලම මිලට විකිණීමට හැකිවුයේ වාහන 3 පමණි. ඉතිරි වාහන 4 ඉහලම මිල ගණන් ඉදිරිපත් කළ අයට දැනුම් දුන්නත් ඔවුන්ගෙන් යහපත් ප්‍රතිචාර නොලැබුනි. ඒ අනුව ඔවුන්ගේ ටෙන්ඩර් තැන්පතු රඳවාගෙන නව ටෙන්ඩරයක් කැඳවන ලදී.

ආ) කාටූන් චරිත වලින් හෙබි සිත් ඇදගන්නා සුළු කවර සහිත නව අභ්‍යාස පොත් වෙළඳපලට පැමිණීම නිසා එම පොත් විකිණීමට බාධා පැමිණුනි. කෙසේ වෙතත් වට්ටම් පිරිනමා එම පොත් විකිණීමට පියවර ගෙන ඇත. නමුත් පාරිභෝගිකයින්ගේ අවම ඉල්ලුම නිසා වට්ටම් සහිතව වුවද එම පොත්වල අලෙවිය ඉතා පහත් මට්ටමක පවතී.

ඇ) 147 ක් ලෙස නම්කර ඇති මෙම කැමරා සහ උපකරණ තොගය හානියට පත්ව සහ යල්පැන ගිය තාක්ෂණය නිසා දශකයකට අධික කාලයක් පාවිච්චියට ගත නොහැකිව තිබුනි. මෙම අයිතමයන්ගේ වටිනාකම. වාර්තා වලින් පවා තහවුරුකරගත නොහැක. එම නිසා සුදුසු පරිදි ඉවත් කිරීමට පියවර ගත යුතුය.

4.5 ආර්ථික නොවු ගණුදෙනු

අ) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සෝදුපත් වල ප්‍රමාදය නිසා මෙය සිදුවිය. ප්‍රමාදය සිදුවුයේ අපගේ කටයුතු සම්පූර්ණවීමෙන් පසුවය. දෙපාර්තමේන්තුවේ බලධාරීන්ට ලිඛිතව හා වාචිකව කරන ලද දැනුම් දීම් වලට කිසිම ප්‍රතිචාරයක් නොලැබුනි. ප්‍රමාදයට හේතු වූ අනෙකුත් සාධක නම් අපට නැවත පිටපත් කිරීමට සිදු වූ ගුණයෙන් බාල පිටපත් කිරීම්, විශේෂ නිවාඩු සහ මුද්‍රණ කඩදාසි

නිෂ්පාදිත රටවල ඇති වූ ස්වභාවික විපත් නිසා මුද්‍රණ කඩදාසි ලබාගැනීමේ ප්‍රමාදයන්ය. එසේ වුවත් අවශ්‍යකරන කඩදාසියේ ගුණාත්මක ප්‍රමිතිය පාවිච්චිකිරීම ස්ථිර කරමින් පූර්ව අනුමැතිය ලබාගෙන ඇත. GSM වල හෝ විනිවිද භාවයේ ඌණ තාවයක් සඳහන් කරමින් ඒක පාර්ශවික දඩයක් පනවා ඇත. කෙසේ වෙතත් සියලුම පොත්පත් නිතර ගෙන්වන කඩදාසි කම්හලෙන්ම නිෂ්පාදිත WOOD FREE කඩදාසි වලින්ම මුද්‍රණය කර ඇත.

ආ) පුවත්පත් නියෝජිතයන්ට නිකුත්කරන පුවත්පත් ප්‍රමාණය නිත්‍ය සීමාවන් ඉක්මවා වැඩිවී ඇත. මහජන සිත් දිනා ගන්නා පුවතක් හෝ ලිපියක් පුවත්පත්වල ඇතුලත් වූ විට නව පුවත්පතක් එළි දක්වන විට හෝ විශේෂ අලෙවි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී දිවයින පුරා ප්‍රමාණවත් පිටපත් සංඛ්‍යාවක් මුද්‍රණය කර දිවයින පුරා බෙදාහැරීම අපගේ ක්‍රමෝපායයි. සමාලෝචනයට භාජනය වන කාල සීමාවතුළ අප නව ප්‍රකාශන ගණනාවක් සහ විකුණුම් ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක් දියත් කර ඇත.

මෙය මෙම අධි සැපයුම නිසා ඉහල ගිය ආපසු එවීම් ප්‍රතිශතයේ ප්‍රතිඵලයක් විය හැක.

4.6 මුදල් කළමනාකරණය

හඳුනාගැනීමට නොහැකි හර හා බැර ශේෂයන් යෝග්‍ය අයුරින් ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

4.7 හඳුනා ගන්නා ලද පාඩු

අ) පුවත්පත් මුද්‍රණ ක්‍රියාවලියේදී සිරිතක් වශයෙන් නරක් වූ සහ අමතර පිටපත් නාස්තිවීම වැලැක්විය නොහැකිය. මුලින්ම මුද්‍රණ යන්ත්‍රය ආරම්භකරන්නේ අවම වේගයකිනි. මුද්‍රණ කාර්ය මණ්ඩලය නිෂ්පාදනය අවශ්‍ය ගුණාත්මක ප්‍රමිතියට එනතුරු නොයෙකුත් අඩුපාඩු නිවැරදි කරති. මෙම තත්ත්වයට එන තෙක් උත්පාදනය වන පිටපත් ස්පොයිල් වශයෙන් හඳුන්වයි. මෙයින් සමහරක් කාර්ය මණ්ඩලයට දෙන නිදහස් පිටපත් සඳහා භාවිතා කරන අතර ශේෂය කිරුම් බරට අලෙවිකරනු ලැබේ. කර්මාන්තයේ පිළිගත් සම්මතයන්ට අනුව අපි 5% ට අඩු ස්පොයිල් ප්‍රමාණයක් පවත්වාගෙන යනු ලැබේ.

මුද්‍රණ යන්ත්‍ර ඉහලම වේගයෙන් ක්‍රියාත්මක වන විට අවශ්‍ය නිවැරදිම මට්ටමේ දී එය නතර කළ නොහැක. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අමතර පිටපත් කිහිපයක් මුද්‍රණය වේ. අවශ්‍යතාවයට අඩු ස්ථානයක දී යන්ත්‍රය නැවතුව හොත් වෙනස පියවීමට යන්ත්‍රය නැවත ක්‍රියාත්මක කල යුතුය. මෙය පලමු මුද්‍රණයේ ආන්තික වැඩිවීම හා සසඳා බලන කල ස්පොයිල් පිටපත් විශාල ප්‍රමාණයක් උත්පාදනය කිරීමකි. අපි 2% ට අඩුවෙන් අතිරේක පිටපත් පවත්වාගෙන යන්නෙමු. මෙම තත්ත්වය කර්මාන්තයේ සම්මතය තුළ පවතී.

ආ) පිළිගතිමු.

4.8 සමාගමේ සම්පත් වෙනත් පාර්ශ්වයන් විසින් උපයෝජනය කිරීම

මෙම නිලධාරීන් රාජ්‍ය අංශයේ ආයතනවලට ඉල්ලීම මත මුදා හැර ඇත.

5. ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය

5.1 වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම

2010 වාර්ෂික වාර්තාව 2012 අගෝස්තු ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත්තෙමු.

6. පද්ධති සහ පාලනය

අ) ගිවිසුම්කරුගේ අත්තිකාරම් ක්‍රියාත්මක කිරීමට අපි නව ක්‍රම පද්ධතියක් හඳුන්වා දී ඇත. 2009 සිට අයකරගත නොහැකි අත්තිකාරම් නොමැත.

ආ) ප්‍රධාන ලෙජරයේ හා ශාඛා සුළු මුදල් පොත්වල අතර දිගුකාලීන නොපියවීම් වල වෙනස හඳුනාගැනීමට ක්‍රියාමාර්ග ගන්නෙමු.

ඇ) වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දැනට මුද්‍රණ ධාරිතා වේ ඉහලම කාර්මික වර්ධනයකට යටත්ව සිටී. ගිණුම් සහ පාලන පද්ධතියේ සමගාමී වැඩි දියුණු කිරීමකට අප සකස්කරමින් සිටිමු.

බන්දුල පද්මකුමාර
සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ

ආදායම් ප්‍රකාශය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2011 රු '000	2010 රු '000
ශුද්ධ ආදායම	1	3,075,267	2,920,218
විකුණුම් පිරිවැය		(1,524,782)	(1,504,768)
දල ලාභය		1,550,485	1,415,449
වෙනත් මෙහෙයුම් ආදායම	3	117,319	107,027
		1,667,805	1,522,476
පරිපාලන වියදම්		(1,230,158)	(1,319,657)
බෙදැහැරීමේ වියදම්		(311,895)	(319,789)
බදු ගෙවීමටපෙර මෙහෙයුම් කටයුතු වලින් ලද ලාභය	2	125,752	(116,969)
මූල්‍ය වියදම්		(111,715)	(70,806)
බදු ගෙවීම් හා ස්වේච්ඡාවෙන් විශ්‍රාම යැමේ වියදම් දැරීමට පෙර ලාභ/(අලාභ)		14,036	(187,775)
ස්වේච්ඡාවෙන් විශ්‍රාමයෑමේ වියදම	6	-	(172,007)
බදු ගෙවීමට පෙර ලාභය/(අලාභ)		14,036	(359,782)
බදු	4	(2,136)	(2,856)
විලම්බිත බදු	9	(22,938)	25,025
බදු වලට පසු ලාභ / (අලාභ)		(11,037)	(337,613)
මූලික/අඩුකල කොටසක ඉපයීම (රුපියල්)	5	(3.17)	(96.91)

ශේෂ පත්‍රය

2011 / දෙසැම්බර් 31 දිනට ශේෂය

වත්කම්	සටහන්	2011 '000	2010 '000
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	7	289,224	226,910
පරිපාලන සමාගම්වල අයෝජනය		7,500	7,500
වෙනත් ආයෝජන	8.1	359	359
විලම්බිත බදු	9	147,219	170,157
		444,303	404,927
ජංගම වත්කම්			
භාණ්ඩ ලේඛන	10	475,184	426,241
වෙළඳ හා අනෙකුත් ලැබීම්	11	834,407	949,096
පරිපාලන සමාගම් වලින් ලැබීම්		955	756
ආදායම් බදු	4	37,756	15,823
කෙටිකාලීන ආයෝජන	8.2	647	647
මුදල් හා මුදලට සමාන වත්කම්		31,398	67,770
		1,380,348	1,460,335
මුළු වත්කම්		1,824,650	1,865,262
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධනය හා සංචිත			
කොටස් ප්‍රාග්ධනය	12	34,837	34,837
සංචිත	13	237,483	248,520
		272,320	283,357
ජංගම නොවන වගකීම්			
විලම්බිත වගකීම්	14	181,440	176,779
පොලී සහිත ණය	15	162,768	162,291
විශ්‍රාම පාරිතෝෂිත සඳහා වෙන්කිරීම්	16	241,509	234,900
සමාගමට එරෙහිව ඇති හිමිකම් වෙනුවෙන් වෙන්කිරීම්	17	10,000	10,000
		595,717	583,971
ජංගම වගකීම්			
වෙළඳ හා අනෙකුත් ගෙවීම්		330,328	183,933
ප්‍රවර්තන වර්ෂය සඳහා දිගු කාලීන ණය	15.1	73,013	55,395
ගෙවිය යුතු ලාභාංශ		77	77
කෙටිකාලීන ණය		279,428	475,671
බැංකු අයිරා		273,768	282,858
		956,614	997,934
මුළු හිමිකම් හා වගකීම්		1,824,650	1,865,262

2007 අංක 7 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව මුල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව සහතික කරමි.

මුල්‍ය අධ්‍යක්ෂක

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ.

සභාපති

මුල්‍ය අධ්‍යක්ෂක

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	2011 රු.	2010 රු.
මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය		
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල (සටහන අ)	204,230,538	42,833,999
පොලි ගෙවීම්	(111,715,367)	(70,805,714)
ආදායම් බදු ගෙවීම්	(24,068,423)	(22,012,561)
පාරිතෝෂික	(35,115,251)	(64,868,849)
සමාගමට එරෙහිව ඇති හිමිකම් සඳහා ගෙවීම්	(2,192,460)	(3,164,274)
ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ වියදම	-	(172,007,306)
මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය	31,139,038	(290,024,705)
ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය		
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(38,267,312)	(105,500,590)
ස්ථාවර වත්කම් විකිණීම	3,202,198	4,676,949
ආයෝජන විකිණීම	-	-
විලම්බිත වගකීම් වැඩිවීම	4,660,717	6,012,913
ලද පොලිය	11,734,653	12,552,116
ලද ලාභාංශ	1,568,902	962,898
ලද කුලී ආදායම	17,512,475	16,950,661
ප්‍රාග්ධන නොනිමි වැඩ වැඩිවීම/ අඩුවීම	(76,928,348)	37,621,777
ආයෝජන කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය ඇතුලට/(පිටත)	(76,516,715)	(26,723,276)
මුදල් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
ණය ගැනීම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම්)	18,094,814	114,303,247
ලාභාංශ ගෙවීම	-	-
ආයෝජන කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය ඇතුලට/(පිටතට)	18,094,814	114,303,247
වර්ෂය තුළ මුදල් හා මුදලට සමාන වත්කම් වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	(27,282,863)	(202,444,735)
වර්ෂය මුල මුදල් හා මුදලට සමාන වත්කම්	(215,087,811)	(12,643,076)
වර්ෂය අවසානයේ මුදල් හා මුදලට සමාන වත්කම් (සටහන – ආ)	(242,370,674)	(215,087,811)
සටහන (ආ) – වසර අවසානයේ මුදල් හා මුදලට සමාන වත්කම් වල විශ්ලේෂණය		
අතැති මුදල් හා බැංකුවේ තැන්පතු	18,994,578	59,572,313
බැංකු අයිරා	(273,768,341)	(282,858,191)
කෙටිකාලීන ආයෝජන	12,403,089	8,198,067
	(242,370,674)	(215,087,811)

(වරහන් තුළ ඇති දත්ත වලින් අඩුකිරීම් දක්වයි).

	2011 රු.	2010 රු.
(ආ) මෙහෙයුම් කටයුතු තුලින් ජනිත වූ මුදල්		
බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය	14,036,475	(359,781,998)
ගැලපීම් සඳහා :		
සමාගමට ඇතිහිමිකම් වෙනුවෙන් වෙන්කිරීම්	2,192,460	3,164,274
ක්ෂයවීම්	52,881,728	51,061,602
ලාභාංශ ආදායම	(1,568,902)	(962,898)
පොලි ආදායම	(11,734,653)	(12,552,116)
කුලී ආදායම	(17,512,475)	(16,950,661)
මූල්‍ය වියදම	111,715,367	70,805,714
පාරිතෝෂිත සඳහා වෙන් කිරීම්	41,723,830	67,846,013
ස්වේච්ඡාවෙන් විශ්‍රාම යෑමේ වියදම	-	172,007,306
ආයෝජන විකිණීමෙන් ලද (ලාභ)/අලාභ	-	-
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද (ලාභ) / අලාභ	(3,202,111)	(4,645,804)
කාරක ප්‍රාග්ධනය ගැලපීමට පෙර මෙහෙයුම් ලාභය	188,531,718	(30,008,568)
ලැබිය යුතු ගිනුම් හි අඩුවීම / (වැඩිවීම)	114,688,967	(115,197,944)
තොග (වැඩිවීම)/අඩුවීම	(48,942,858)	(161,926,246)
පරිපාලිත සමාගම් හි ජංගම ගිනුමෙහි වැඩිවීම/(අඩුවීම)	(198,769)	(281,832)
ගෙවිය යුතු ගිණුම් හි (අඩුවීම)/වැඩිවීම	(52,048,187)	349,688,589
තැන්පතු ලැබීම් වල වැඩිවීම/(අඩුවීම)	2,199,667	560,000
මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල්	204,230,538	42,833,999

හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

2011 දෙසැම්බර් 31 දිනට

රු.'000

	කොටස් ප්‍රාග්ධනය	පොදු සංචිත	ලාභාලාභ	එකතුව
2010.01.01 දිනට ශේෂය	34,837	758,974	(172,841)	620,970
වසර සඳහා ශුද්ධ ලාභය			(337,613)	(337,613)
මාරු කිරීම්	-	-	-	-
2010.12.31 දිනට ශේෂය	34,837	758,974	(510,454)	283,357
2011.01.01 දිනට ශේෂය	34,837	758,974	(510,454)	283,357
වසර සඳහා ශුද්ධ ලාභය			(11,037)	(11,037)
මාරු කිරීම්		-	-	-
2011.12.31 දිනට ශේෂය	34,837	758,974	(521,491)	272,320

1. ආයතනික තොරතුරු

1.1 පොදු

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සීමිත පොදු සමාගමක් ලෙස ශ්‍රී ලංකාවේදී සංස්ථාපනය කරන ලදී. ලියාපදිංචි කාර්යාලය නො. 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10, ස්ථානයේ පිහිටුවා ඇත.

1.1 මූලික ක්‍රියාකාරකම්

සමාගමේ ප්‍රමුඛතම ක්‍රියාකාරකම් වනුයේ පුවත්පත් මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ පුවත්පත් සහ සඟරා බෙදාහැරීමත්ය.

2. පොදු ගිණුම් ප්‍රතිපත්ති

2.1 පොදු

අනුකූලතා ප්‍රකාශය

ආයතනයේ මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම සංකල්ප හා ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇත.

සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ ඓතිහාසික පිරිවැය සම්මුතිය පදනම්වයි. උද්ධමනාත්මක සාධක සඳහා ගිණුම්වල ගැලපීම් කර නොමැත. ව්‍යතිරේඛයන් සහ විසර්ජනයන් ඇති අවස්ථාවලදී ද අනුගමනය කර ඇති ගිණුම් ප්‍රතිපත්තීන් පිළිබඳව සටහන් මගින් හෙළිදරව් කොට ඇත.

2.2 අඛණ්ඩ පැවැත්ම

ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රතිපාදන ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ. මේ හේතුව නිසා මෙම ආයතනය මූල්‍යම වාර්තා සැකසීමේදී "අඛණ්ඩ පැවැත්ම" පදනම අනුගමනය කරයි.

2.3 සංසන්දනාත්මක තොරතුරු

පවතින වර්ෂයේ ඉදිරිපත් කිරීම සඳහා සංසන්දනාත්මක තොරතුරු අවශ්‍යතාවයට අනුව නැවත වර්ග කළ හැක.

2.4 පරිපාලිත සමාගම

මුළුමනින්ම සමාගම සතුව පවත්නා නිවාස ඉදිකිරීම් හා විකිණීම් සඳහා වන ලේක්හවුස් දේපල සංවර්ධන (පුද්ගලික) සමාගම මෙතෙක් මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොමැත. මව් සමාගමේ සහ පරිපාලිත සමාගමේ ක්‍රියාකාරකම් අතර පවත්නා අසමානකම් හේතු කොට ගෙන පරිපාලන සමාගමේ ගිණුම් මව් සමාගමේ ගිණුම් සමග ඒකාබද්ධ කර නොමැත.

2.5 විදේශ මුදල්

ශේෂ පත්‍රය දිනට පවත්නා විනිමය අනුපාත අනුව විදේශ මුදල් වූ වත්කම් හා වගකීම් හි අගය දේශීය මුදලට පරිවර්තනය කර ඇත.ඒ අනුව ඇති ලාභය හෝ අලාභය ගිණුම් ප්‍රකාශයට ගලපා ඇත.

3. වත්කම් සහ එහි වටිනාකම අගය කිරීමේ පදනම

3.1 ලැබිය යුතු ගිණුම්

බොල්ණය සහ අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමෙන් අනතුරුව, උපලබ්ධි වේ යැයි ඇස්තමේන්තු ගත ප්‍රමාණය ලැබිය යුතු ගිණුම් වශයෙන් දක්වා ඇත. මුදල් එකතුව වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් බොල් ණය සහ අඩමාන ණය සඳහා වෙන්කිරීමේ අඩුවක් පෙන්නුම් කර ඇත.

3.2 බොල් හා අඩමාන ණය සඳහා වෙන් කිරීම

වර්ෂයකට වඩා වැඩි ණය ගැතියන් සඳහා සම්පූර්ණයෙන්ම බොල් හා අඩමාන ණය වෙන් කිරීමක් සිදු කරයි.

3.3 බඩු ලේඛන

බඩු ලේඛන පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත ගණනය කර ඇත. මෙහිදී පිරිවැය වශයෙන් සලකන ලද්දේ මිලට ගැනීමේ පිරිවැය ආශ්‍රිත සියලු විය පැහැදම් එකතු කළ වටිනාකමය. මුද්‍රණ කඩදාසි හැර අනෙකුත් සියලුම බඩු ලේඛන, ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් පදනම මත ගණනය කර ඇත. පුවත්පත් මුද්‍රණ කඩදාසි තොග ගණනය කිරීම සඳහා බරිත සාමාන්‍ය මිල ක්‍රමය යොදාගෙන ඇත.

3.4 ආයෝජන

ආයෝජන ඒවායේ වටිනාකම පිරිවැයෙන් ස්ථාවර මිල පහලයාම් සඳහා වෙන්කිරීම් කළ පසු දක්වා ඇත.

3.5 දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ වල පිරිවැය නොහොත් අගය ක්ෂය වීම සඳහා අඩුකිරීම් වලින් පසු දක්වා ඇත. මේවායේ පිරිවැය එහි ගැනුම් මිල මෙම වත්කම් ප්‍රයෝජනයට ගැනීමට සුදුසු වනතෙක් දැරීමට සිදුවූ සියලු සෘජු පිරිවැයන්ද ඇතුළත් කොට ඇත.

සමාගම දේපල පිරියත හා උපකරණ සඳහා වන ක්ෂය වීම ස්ථාවර පදනමක් මත ඇස්තමේන්තු ගත ඵලදායි ජීව කාලයට සමාන කාලයක් තුළ පහත දැක්වෙන පරිදි සරල මාර්ග ක්‍රමයට ගණනය කර ඇත.

	එළදායි ජීවකාලය අවුරුදු	ක්ෂය අනුපාතය වර්ෂයකට
	-----------	---------
පැරණි ගොඩනැගිලි	25	4.0%
නව ගොඩනැගිලි	20	5.0%
පිරියත හා උපකරණ	08	12.5%
රථවාහන	04	25.0%
ගෘහභාණ්ඩ හා උපකරණ	08	12.5%
පරිගණක	04	25.0%
වායුසමීකරණ	04	25.0%

ඉඩම් සඳහා ක්ෂය ප්‍රතිපාදනයන් සිදුකර නොමැත. වත්කමක් ක්ෂය කිරීම ආරම්භ කරනුයේ එය ප්‍රයෝජනයට ගන්නා විටය. අවසන් කරනුයේ වත්කම භාවිතයට ගන්නා අවසාන දිනට සහ වත්කම වත්කමක් ලෙස හඳුනා නොගන්නා දින තෙක්ය.

3.6 දේපළ පිරියත හා උපකරණ හා කල්බදු ගැනීම්

මූල්‍ය කල්බදු යටතේ ලබාගෙන ඇති වත්කම්වල හිමිකම, එම වත්කම් හි මුදල් වටිනාකම මත ප්‍රාග්ධන කෙරේ. එම වත්කම් සමාගමේ අනිකුත් දේපල පිරියත හා ,උපකරණ සඳහා වන ක්ෂය අනුපාතය පදනම් කරගෙන ක්ෂය වීම් කරනු ලැබේ.

3.7 මුදල් හා මුදලට සමාන දෑ

අතේ ඇති මුදල්, බැංකුවල තැන්පතු සහ ඇමතුම් තැන්පතු මුදල් හා මුදලට සමාන දෑ වලට අයත්වේ. අරමුදල් ප්‍රවාහන ප්‍රකාශන වල අදහස් කරන පරිදි අතේ ඇති මුදල්, ඇමතුම් තැන්පතු, බැංකු වල තැන්පතු හා බැංකු අයිරා, මුදල් හා මුදලට සමාන දෑ වල ඇතුළත්වේ.

4. වගකීම් සහ වෙන් කිරීම්

4.1 වෙන්කිරීම්

ශේෂ පත්‍ර දිනය වන විට පවත්නා සියලු වගකීම් සඳහා පහසුකම් සැලසෙන අතර, එවන් වගකීම් මගින් සම්පත් පිටතට ඇදීයාමක් සිදුවන අතරම පිටතට ඇදියාමේ අවශ්‍ය ප්‍රමාණය පිළිබඳ විශ්වාසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කළ හැකිය.

4.2 අර්ථ දැක්වූ ප්‍රතිපාදන සැලසුම් - පාරිතෝෂිත

1983 අංක 12 දරන විශ්‍රාම පාරිතෝෂික පනත යටතේ විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් සඳහා ස්වාධීන අරමුදලක් පිහිටුවා ඇත. සමාගමේ විශ්‍රාම පාරිතෝෂිත ගෙවීම් යෝජනා ක්‍රමය අනුව ගෙවිය යුතු අමතර විශ්‍රාම පාරිතෝෂිතය සඳහා අවශ්‍ය වන සියලුම වෙන් කිරීම් සමාගමේ ගිණුම්වල දක්වා ඇත. ප්‍රවර්ථන වසරේ පාරිතෝෂිත ගෙවීම ගණනය කරන්නේ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 16 (සංශෝධිත) ට අනුකූලවයි.

2008 ජුනි මස 05 දිනට පෙර සේවයට බැඳුණු සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමේ පදනම ආයතනයේ යෝජනා ක්‍රමයට අනුව පහත පරිදි වේ.

සේවය කළ වර්ෂ ගණන	පදනම : සේවය කර ඇති එක් වර්ෂයක් වෙනුවෙන් විශ්‍රාම යාමේදී හෝ සේවයෙන් අස්වීමේදී වැටුප හිමි සති ගණන
---------------	----------------
25 ට වැඩි	6
20 - 25 දක්වා	4
5 - 20 දක්වා	3

2008 ජුනි මස 05 දිනට පසු සේවයට බැඳුණු සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමේ පදනම පහත පරිදි වේ.

සේවය කළ වර්ෂ ගණන	පදනම : සේවය කර ඇති එක් වර්ෂයක් වෙනුවෙන් විශ්‍රාම යාමේදී හෝ සේවයෙන් අස්වීමේදී වැටුප හිමි සති ගණන
---------------	----------------
25 ට වැඩි	3
5 - 20 දක්වා	2

4.3 සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා සැලසුම්

සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා දායක මුදල් අදාළ පනත්වල දැක්වෙන රීති වලට අනුකූලව ලැබීමට සුදුසුවේ. සමාගම පිළිවෙළින් දළ වැටුපෙන් 15% සහ 3% ක මුදලක් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායකවේ.

4.4 අසම්භාව්‍ය සිද්ධීන්

මූල්‍ය ප්‍රකාශයට අදාළ සටහන් අංක 19 මගින් අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කොට ඇත.

5. ආදයම් ප්‍රකාශය

5.1 ආදයම් හඳුනාගැනීම

සමාගමේ ආදායම, බෙදාහැරීම හා දැන්වීම් යන ආදායම් වල එකතුවෙන් එකතු කළ වටිනාකම මත බදු හා කොමිස් ඉවත්කර ඉදිරිපත් කර ඇත.

5.2 ආදායම් ප්‍රකාශයේ බදු ගෙවීමට පෙර ලාභය ගණනය කර ඇත්තේ, හඳුනාගත් සියලු වගකීම්, දේපළ පිරියත හා උපකරණ, ක්ෂයවීම්, ඇතුලු බොල් ණය හා අඩමාණ ණය සඳහා වූ වෙන් කිරීම් වලින් පසුවය.

5.3 වියදම්

වර්ෂය තුළ ඉපයූ ලාභය ගණනය කිරීමේදී ව්‍යාපාර කටයුතු සඳහා කළ සියලු වියදම් සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා නඩත්තු කිරීම, ආදායම් වලින් අයකර ගෙන ඇත.

5.4 ලාභාංශ ආදයම

අනෙකුත් සමාගම්වල ආයෝජනයන්ගෙන් ලැබිය යුතු ලාභාංශ ආදායම, ලැබීමට හිමිකම් ලද වර්ෂයේදී හඳුනාගෙන ඇත.

5.5 දේපල පිරියත හා උපකරණ ඉවත්කිරීම් මත ලාභ සහ අලාභ

දේපල පිරියත හා උපකරණ ඉවත් කිරීම් මත අයහාර ස්වභාවයේ ඇති ලාභ හා අලාභ ආදායම් වාර්තාවේ ගණනය කර ඇත.

5.6 ණය ගැනීමේ පිරිවැය

ණය ගැනීමේ පිරිවැය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 20 පරිදි වැයවීම සිදුවූ කාලය තුළ, ණය ගැනීම් පිරිවැය ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස දක්වා ඇත.

5.7 ස්වෙච්ඡාවෙන් විශ්‍රාම යෑමේ වියදම

ස්වේච්ඡාවෙන් විශ්‍රාම යෑමේ වියදම කාල පරිඡේදයට අදාළව ආදායම් ප්‍රකාශනවල වියදමක් ලෙස ඇතුලත් කොට ඇත. ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිති වලට අනුකූලවද ඇතුලත් කොට ඇත.

6. මුදල් ප්‍රවාහය

සමාගම් මුදල් ප්‍රවාහය, මුදල් ප්‍රවාහ ප්‍රකාශ සම්බන්ධයෙන් ඇති විධිවිධාන යටතේ ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 9 ට අනුව වක්‍ර ක්‍රමයකට ඉදිරිපත් කොට ඇත.

7. බදුකරණය

2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත සහ ඊට අදාළ පසුව සිදුවූ සංශෝධන වලට අනුකූලව වර්ෂයට අදාළ ලාභය ආදායම් බදු සඳහා සකස්කළ පදනම මත ආදායම් බදු ගෙවීමට බැඳීසිටී.

විලම්භිත බදුකරණය

අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්, බදු අයකළ හැකි ලාභ, අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් වලට එරෙහිව යොදා ගත හැකිවිය හැකිය යන ප්‍රමාණයෙන් අපි විලම්බිත ආදායම් බදු වත්කම් හඳුනා ගනිමු.

එක් එක් ශේෂ පත්‍ර දිනට විලම්බිත ආදායම් බදු ප්‍රමාණය සහ තවදුරටත් භාවිතයට ගත හැකි විලම්බිත ආදායම් බදු වත්කම් සියල්ලට හෝ කොටසකට හෝ ඉඩ හැරීමට හැකි විය නොහැකි වන ප්‍රමාණයට අඩුකළ වත්කම් ඉදිරියට ගෙන යන අයුරු අපි ඇගැයීමට ලක් කරමු.

8. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසුව ඇතිවන ප්‍රමාණාත්මක අවස්ථා සහ අවශ්‍යතා අනුව අප මෙම මූල්‍ය ප්‍රකාශ වලට ගැලපීම හෝ අනාවරණය කිරීම සිදු කරයි.

9. අධ්‍යක්ෂකවරුන්ගේ වගකිවයුතු ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. කරුණාකර මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය බලන්න.

මුදල් ප්‍රකාශනවල සටහන්

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

	රු.'000 2011	රු.'000 2010
1 පිරිවැටුම		
ඉරිදා ඔබ්සර්වර්	914,388	805,963
ඩේලිනිවුස්	845,339	760,790
දිනමිණ	400,307	331,175
සිළුමිණ	417,858	456,867
තිනකරන්	132,559	88,981
තිනකරන්/වාරමංජරි	24,404	15,877
	2,734,855	**2,459,653**
තරුණී	72,789	67,652
මිහිර	21,272	18,722
සරසවිය	10,001	9,574
බුදුසරණ	36,477	22,364
නවයුගය	2,677	2,677
සුබසෙත	22,397	18,341
ක්‍රීඩා	11,291	8,602
ආරෝග්‍යා	10,114	-
මාංචු	12,681	-
විදුනැණ	7,887	-
නමස්කාර	5,478	-
වන්නා වානවිල්	1,766	-
	214,830	**147,932**
වාණිජ මුද්‍රණ - (පිටස්තර)	124,286	310,593
වාර්ෂික ප්‍රකාශන	1,297	2,040
	125,583	**312,633**
මුළු පිරිවැටුම	**3,075,268**	**2,920,218**

2 පහත දැක්වෙන වියදම් ඇතුළුව සියලුම වියදම් අඩුකිරීමෙන් පසු මෙහෙයුම් ලාභය ගණනය කර ඇත.

	රු.'000 2011	රු.'000 2010
අධ්‍යක්ෂවරුන්ගේ දීමනා	7,208	7,091
ක්ෂයවීම්	52,882	51,062
විගණන ගාස්තු	692	659
පරිත්‍යාග	1,600	3,300
සේවක අර්ථ සාධක අරමුදලට ආයතනයේ දායකත්වය	73,800	74,963
සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලට ආයතනයේ දායකත්වය	14,760	14,992
පාරිතෝෂික වෙන්කිරීම්	51,734	81,317

3 වෙනත් මෙහෙයුම් ආදයම්

	රු.'000 2011	රු.'000 2010
පොලී ආදායම	11,735	12,552
මිලකළ සමාගම් වලින් ලද ආදායම	1,569	963
දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලාභය	3,202	4,646
පැරණි පුවත්පත් විකුනුම්	42,046	37,324
අමුද්‍රව්‍ය විකුණුම්	45	(229)
කුලී ආදායම්	17,512	16,951
ඡායා පිටපත්	597	489
බොල් සහ අඩමාන ණය සඳහා වැඩිපුර වෙන්කිරීම්	-	394
විදේශ විනිමය ලාභ/පාඩු	(206)	(647)
ශාඛා කාර්යාල හා ගබඩා	7,368	8,018
විවිධ ආදායම්	33,451	26,566
	117,319	**107,027**

4 ලාභය මත සංයුක්ත බදු

සමාගමේ බදු සඳහා වගකීම වාර්ෂික බදු අයකළ හැකි ලාභයෙන් 28% කි. බදු සඳහා වෙන් කිරීම් පිළිබඳ වෙනස් වීම් පහතින් දැක්වේ.

	Rs.'000 2011	Rs.'000 2010
වර්ෂය ආරම්භයේදී	(15,823)	3,333
වර්ෂය සඳහා බදු වෙන්කිරීම්	2,136	2,856
උප එකතුව	(13,688)	6,189
වර්ෂය තුළ ගෙවීම්	(24,068)	(22,013)
වර්ෂය අවසානයේදී	**(37,756)**	**(15,823)**

5 මූලික/අඩුකළ කොටසක ඉපයීම

2010.10.31 දිනට හා 2011.12.31 දිනට කොටසක ඉපයුම ලබාගෙන ඇත්තේ අදාළ බදුවලට පසු ලාභය 2011.12.31 දිනට ඇති මුළු සාමාන්‍ය කොටස් ප්‍රමාණයෙන් බෙදීමෙනි.

	රු.'000 2011	රු.'000 2010
බදු අඩුකිරීමෙන් පසු ශුද්ධ ලාභය	(11,037)	(337,613)
සාමාන්‍ය කොටස් එකතුව	3,484	3,484
පදනම/අඩුකළ කොටසක මූලික ඉපයීම	**(3.17)**	**(96.91)**

6 ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයේ වියදම

ස්වේච්ඡාවෙන් විශ්‍රාමයාමේ යෝජනා ක්‍රමයේ වර්ෂය තුළ මුළු වියදම 2010 ආදායම් ප්‍රකාශයේ සටහන් කොට ඇත.

7 දේපල පිරියත හා උපකරණ

	සින්නක්කර ඉඩම්	සින්නක්කර ගොඩනැගිලි	පරිගණක හා සවිකිරීම්	පිරියත හා යන්ත්‍රෝපකරණ	රථවාහන සහ ගරාජ උපකරණ රු. 000	රථවාහන කල්බදු	ගෘහ භාණ්ඩ සවිකිරීම් හා උපකරණ	පරිගණක කල්බදු	එකතුව
පිරිවැය 2011.01.01 දිනට ශේෂය	29,355	76,092,553	137,984,062	900,182,892	49,190,535	73,782,180	30,651,316	4,167,848	1,272,080,740
එකතුව	-	-	16,875,400	20,588,198	216,236		587,477	-	38,267,312
ඉවත්කිරීම	-	-	(1,810,022)	(5,920,651)	(1,115,617)		(2,513,800)	-	(11,360,090)
	29,355	**76,092,553**	**153,049,440**	**914,850,439**	**48,291,155**	**73,782,180**	**28,724,993**	**4,167,848**	**1,298,987,961**
ක්ෂයවීම්									
2011.01.01 දිනට ශේෂ	-	68,714,486	104,457,224	743,557,416	44,679,927	53,112,361	26,481,634	4,167,847	1,045,170,896
වර්ෂය තුළ අයකිරීම්	-	2,794,584	12,359,108	29,178,627	1,502,499	5,937,500	1,109,408	-	52,881,728
ඉවත්කිරීම	-		(1,809,993)	(5,920,629)	(1,115,615)		(2,513,765)		(11,360,002)
	-	71,509,071	115,006,339	766,815,415	45,066,812	59,049,861	25,077,277	4,167,847	1,086,692,621
	29,355	**4,583,482**	**38,043,100**	**148,035,024**	**3,224,342**	**14,732,319**	**3,647,716**	**1**	**212,295,340**
නොනිමි ප්‍රාග්ධනය	-	-	-	76,928,348	-	-	-	-	76,928,348
2011.12.31 දිනට ශුද්ධ පොත් අගය	**29,355**	**4,583,482**	**38,043,100**	**224,963,372**	**3,224,342**	**14,732,319**	**3,647,716**	**1**	**289,223,688**

* කොටහේන ඉඩම නිදහස් දේපල නියෝජනය කරයි.
* පහත සඳහන් ඉඩම් 99 අවුරුදු බදු පදනමට ගිවිසුම් ගෙන ඇති අතර එය මෙහෙයුම් බදු වලට යටත්වේ.

ලේක්හවුස් ආයතනයේ ප්‍රධාන කාර්යාලය,
කතරගම ශාඛාව

8 ආයෝජන

8.1 අනෙකුත් ආයෝජන

	2011			2010		
	කොටස් ප්‍රමාණය	**පිරිවැය**	වෙළඳ වටිනාකම	කොටස් ප්‍රමාණය	**පිරිවැය**	වෙළඳ වටිනාකම
		රු.'000	රු.'000		**රු.'000**	රු.'000
අ) වෙළඳ (මිල නොකළ)						
සී.ස. ලංකා පුවත් රු. 1000 බැගින් වූ කොටස් 13 පිරිවැය	13	**13**	-	13	**13**	-
සී.ස. ප්‍රෙස් ට්‍රස්ට් ඔෆ් සිලෝන් රු. 100 බැගින් වූ කොටස් 600	600	**60**	-	600	**60**	-
		73	-		**73**	-
ආ) වාණිජ (මිල නොකළ)						
සී.ස. නැෂනල් නිවුස් පේපර්ස් මිල්ස්	100	**1**	-	100	**1**	-
නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථාව රු. 100 බැගින් වූ කොටස්	18,000	**300**	25,205	18,000	**300**	-
සී.ස. ඇසෝසියේටඩ් ඉන්වෙස්ට්මන්ට් රු. 100 බැගින් වූ කොටස්	3,480	**29**	-	3,480	**29**	-
සී.ස. ගෝල්ෆේස් හොටෙල් රු. 100 බැගින් වූ කොටස්	4	**16**	-	4	**16**	-
		346	25,205		**346**	-
අඩුකළා : අලාභ සඳහා වෙන් කිරීම් (ඈවරකිරීමේදී)		**(60)**			**(60)**	
එකතුව		**359**	**25,205**		**359**	-

සටහන

ඈවර කරමින් පවතින සී/ස ප්‍රෙස් ට්‍රස්ට් ඔෆ් සිලෝන් හි ආයෝජනය වෙනුවෙන් රු. 60,000/- ක විශේෂ වෙන්කිරීමක් (100%) කර ඇත.

8.2 කෙටිකාලීන ආයෝජන

	2011			2010		
	කොටස් ප්‍රමාණය	පිරිවැය	වෙළඳ වටිනාකම	කොටස් ප්‍රමාණය	පිරිවැය	වෙළඳ වටිනාකම
		රු.'000	රු.'000		රු.'000	රු.'000
වාණිජ (මිල කළ)						
සී.ස. කාර්ගිල්ස් සිලෝන් ලිමිටඩ් රු. 1 බැගින් වූ කොටස්	799,840	**34**	162,368	799,840	**34**	156,289
කොමර්ෂල් බැංකුව (ඡන්ද හිමි නොවන)	63,706	**614**	4,708	42,479	**614**	10,316
		647	167,075		**647**	166,605

9 විලම්භිත බදු

	රු.'000 2011	රු.'000 2010
ආරම්භක ශේෂය	170,157	145,133
එකතු කිරීම්	-	43,166
ක්‍රමක්ෂය	(22,938)	(18,142)
අවසන් ශේෂය	**147,219**	**170,157**

ආදායම් බදු ගණනය කිරීම සඳහා ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයේ වියදම අවුරුදු 10 ක් තුළදී හිලව් කිරීමට අනුමැතිය දෙන ලදී. එබැවින් ආයතනය ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ මුළු වියදම 2008 හා 2010 ආදායම් ප්‍රකාශයට ඇතුළත් කර ස්වේච්චාවෙන් විශ්‍රාම ගැන්වීමෙහි යෝජනා ක්‍රමය නිසා පැනනැගුණු තාවකාලික වෙනස පෙන්වීමට විලම්භිත ආදායම් බදු වත්කමක් ලෙස හඳුන්වා දී ඇත.

10 තොග සහ නොනිම් වැඩ

	රු.'000 2011	රු.'000 2010
මුද්‍රණ කඩදාසි	234,401	173,076
මාර්ගස්ථ බඩු තොග	2,881	12,743
අමතර කොටස් - යන්ත්‍රෝපකරණ	90,619	91,836
රථවාහන	4,913	4,261
වැඩිපුර නිකුත්කර ඇති පුවත්පත්	749	498
වාණිජ මුද්‍රණ අමුද්‍රව්‍ය	107,510	112,813
ශාඛා කාර්යාල	9,665	9,325
අනෙකුත්	28,191	24,152
	478,929	428,704
නොනිම් වැඩ (වාණිජ මුද්‍රණ)	10,482	11,763
	489,410	440,768
අඩුකිරීම් – යල්පැනගිය තොග සහ ජලනය නොවන තොග සඳහා වෙන්කිරීම්	14,226	14,226
	475,184	**426,241**

11 ලැබිය යුතු ගිණුම්

	රු.'000 2011	රු.'000 2010
වෙළඳ ණය ගැතියෝ	603,969	699,196
අඩමාණ ණය සඳහා වෙන්කිරීම්	(48,817)	(49,607)
	555,151	649,588
වෙනත් ලැබීම්	290,425	310,677
අඩමාණ ලැබීම් සඳහා වෙන්කිරීම්	(11,169)	(11,169)
	834,407	**949,096**

12 කොටස් ප්‍රාග්ධනය

	රු.'000 2011	රු.'000 2010
අනුදත් ප්‍රාග්ධනය රු. 10/- සාමාන්‍ය කොටස් 5,000,000	50,000	50,000
නිකුත් කළ හා ගෙවා නිමි රු. 10 සාමාන්‍ය කොටස් 3,483,714	**34,837**	**34,837**

13 සංචිත

පොදු සංචිත	රු.'000 2011	රු.'000 2010
ආරම්භක ශේෂය	758,974	758,974
ගැලපීම්	-	-
ලාභාලාභ ගිණුමෙන් මාරුකිරීම්	-	-
අවසාන ශේෂය	758,974	758,974
එකතු වූ ලාභය	(521,491)	(510,454)
	237,483	**248,520**

14 විලම්භිත වගකීම්

	රු.'000 2011	රු.'000 2010
තැන්පතු		
පුවත්පත් බෙදාහරින්නන්	113,811	108,945
නිත්‍ය දැන්වීම්කරුවන්	54,866	54,946
පරිපාලිත සමාගමින් ලබාගත් ණය	3,500	3,500
වෙනත් තැන්පතු	9,262	9,388
	181,440	**176,779**

පුවත්පත් බෙදාහරින්නන්, නිත්‍ය දැන්වීම්කරුවන්ගෙන් සහ වෙනත් අයගෙන් ලබාගත් තැන්පතු ශේෂ පත්‍ර දින සිට වසරක් තුළ ආපසු ගෙවීමක් සාමාන්‍යයෙන් සිදු නොකරයි.

15 ණය සඳහා දරන පොලිය

	රු.'000 2011	රු.'000 2010
මූල්‍ය කල්බදු	11,837	20,658
දිගුකාලීන ණය	150,931	141,634
	162,768	162,291

15.1 නැවත ගෙවීම්වල විශ්ලේෂණය

	වසර 1 තුළ	වසර 1 සිට 5 දක්වා	වසර 5 වැඩි
මූල්‍ය කල්බදු	6,495	11,837	-
දිගුකාලීන ණය	66,518	150,931	-
	73,013	**162,768**	**-**

16 පාරිතෝෂික සඳහා වෙන්කිරීම්

දේශීය ආදායම් කොමසාරිස්තුමාගේ අනුමැතිය ඇතිව 1983 අංක 12 දරන විශ්‍රාම පාරිතෝෂික පනත යටතේ ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවීම සඳහා ස්වාධීන අරමුදලක් සමාගම විසින් පවත්වාගෙන යනු ලැබේ.

1994 අගෝස්තු මස 4 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි සමාගමේ සියලුම සේවකයන්ට බලපාන පරිදි අමතර විශ්‍රාම පාරිතෝෂිකයක් ගෙවීම සඳහා අවශ්‍ය සම්පූර්ණ ප්‍රතිපාදනය ගිණුම්ගත කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (සංශෝධිත) ප්‍රකාරව 2011.12.31 දිනට මුළු විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සකස් කරන ලද්දේ සුදුසු ලෙස සංශෝධනය කළ පාරිතෝෂික දීමනා සූත්‍රයට අනුවයි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (සංශෝධිත) ප්‍රකාරව ශේෂ පත්‍රයේ දැක්වෙන විශ්‍රාම පාරිතෝෂික වගකීම වනුයේ ශේෂ පත්‍ර දිනට නිශ්චිත විශ්‍රාම පාරිතෝෂිත බැදීම හා ස්වාධීන අරමුදලේ සාධාරණ අගය අතර වෙනසය.

2011.12.31 දිනට වෙන් කිරීම් පහත පරිදි වේ.	**රු.'000**	**රු.'000**
	2011	**2010**
භාරකාර අරමුදලේ ඇති ශේෂය (ආසන්න වශයෙන්)	226,068	219,120
ගිණුම්කර ඇති වෙන්කිරීම්		
වර්ෂය ආරම්භයේදී	234,900	231,923
වර්ෂය තුළ ගෙවීම්	(35,115)	(64,869)
	199,785	167,054
වර්ෂය තුළ ලාභාලාභ ගිණුමට හරකරන ලද වෙන්කිරීම්	41,724	67,846
වර්ෂය අවසානයේ	**241,509**	**234,900**
දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු සම්පූර්ණ පාරිතෝෂිකය	467,577	454,020

පාරිතෝෂික දීමනා ගණනය කිරීම සඳහා පහත සඳහන් මූලික උපකල්පනයන් යොදාගන්නා ලදී.

	2011	**2010**
වට්ටම් අනුපාතය	9.15 %	9.15 %
වැටුප් වැඩිවීමේ අපේක්ෂිත අනුපාතය	7.87 %	7.87 %

17 සමාගමට එරෙහිව ඇති හිමිකම් වෙනුවෙන් වෙන් කිරීම්

	රු.'000	**රු.'000**
	2011	**2010**
වර්ෂය ආරම්භයේදී	10,000	10,000
වර්ෂය තුළ වෙන්කිරීම් (නැවත එකතු කිරීම්)	2,192	3,164
	12,192	13,164
වර්ෂය තුළ ගෙවීම්	(2,192)	(3,164)
වර්ෂය අවසානයේදී	10,000	10,000

18 අදාළ පාර්ශව පිළිබඳ හෙළිදරව් කිරීම්

18.1 ප්‍රධාන කළමනාකාරවරුන්

අධ්‍යක්ෂවරුන් සමාගමේ ප්‍රධාන කළමනාකාරවරුන් වේ.

18.2 කොටස් ප්‍රාග්ධනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ හිමිකම්

18.3 2011.12.31 දිනට කොටස් ප්‍රාග්ධනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ හිමිකම් පහත පරිදි වේ.

	කොටස් ගණන
බන්දුල පද්මකුමාර මහතා	නැත
සන්ද්‍රසේගරම් සන්මුගනාදන් මහතා	නැත
එදිරිසිංහ විතානගේ ප්‍රසාද් රසංග හරිස්චන්ද්‍ර මහතා	1
උපුල් රංජන් සමරසිංහ දිසානායක මහතා	නැත
සීලරත්න සෙනරත් මහතා	1

18.4 අධ්‍යක්ෂවරුන්ට දුන් ණය

ආයතනය විසින් අධ්‍යක්ෂවරුන් සඳහා ණය දී නොමැත.

18.5 ප්‍රධාන කළමනාකරුවන් සඳහා වන්දි

අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 2 යටතේ ඇතුළත් වේ.

19 අසම්භාව්‍ය බැරකම්

සමාගමට එරෙහිව තීන්දු බලාපොරොත්තුවෙන් නඩු 73 ක් පවතිනු ඇත.
සමාගමට එරෙහිව ඇති හිමිකම් වෙනුවෙන් වෙන් කිරීම් සිදු කර ඇත.

20 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට හෝ අනාවරණය කිරීමට තරම් දෙයක් සිදු වූයේ නැත.

	2011		2010	
		%		%
එකතුකල වටිනාකම				
ආදායම	3,075		2,920	
වෙනත් ආදායම්	117		107	
	3,193		3,027	
අමුද්‍රව්‍ය හා සේවා මිලදී ගැනීම්	(1,549)		(1,750)	
	1,643	100%	(1,504)	100%
එකතුකල වටිනාකමේ බෙදා දැක්වීම				
සේවකයින්ට				
වැටුප් වේතන හා වෙනත් ප්‍රතිලාභ	1,377	84%	1,469	98%
ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ වියදම	-	0.0%	172	11%
රජයට				
ආදායම් බද්ද	2	0.1%	3	0.2%
ජාතිය ගොඩනැගීමේ බද්ද	64	4%	80	5%
වරිපනම්	24	1%	21	1%
ණය හිමියන්ට				
පොලී සහ ඒ සම්බන්ධ වියදම්	112	7%	71	5%
ප්‍රාග්ධන ප්‍රතිපාදකයින්ට				
කොටස්කරුවන්ට ලාභාංශ - යෝජනා කළ		0.0%		0%
වෙළඳ ව්‍යාප්තියට හා වර්ධනයට				
ක්ෂය	53	3%	51	3%
විලම්බිත බදු	23	1%	(25)	-2%
සංචිත	(11)	-1%	(338)	-22%
	1,643	100%	1,504	100%





දස අවුරුදු සාරාංශය

	2011	2010	2009	2008	2007	2006	2005	2004	2003	2002
තෝරාගත් මූල්‍ය දත්ත (රු. මිලියන)										
වෙළඳ ප්‍රතිඵල										
පිරිවැටුම	3,075.3	2,920.2	2,887.4	3,098.2	3,095.6	2,959.0	2,631.3	2,221.8	2,039.1	1,720.0
වාර්ෂික අලෙවි වර්ධනය	5.3	1.1	(6.8)	0.1	4.6	12.5	18.4	9.0	18.6	7.4
බදු පෙර ලාභය	14.0	(359.8)	82.4	(385.5)	31.9	14.9	187.2	5.9	140.4	150.6
ලාභ මත බදු	25.1	2.9	27.5	11.6	10.8	-	74.9	29.8	58.8	57.0
බදු පසු ලාභය	(11.0)	(337.6)	54.9	(233.9)	21.1	14.9	112.2	21.2	81.6	93.6
කොටස් කරුවන්ගේ අරමුදල										
කොටස් ප්‍රාග්ධනය	34.8	34.8	34.8	34.8	34.8	34.8	34.8	34.8	34.8	34.8
සංචිත	237.5	248.5	586.1	531.2	760.7	757.0	761.0	648.8	580.7	494.3
	272.3	283.4	621.0	566.1	795.6	791.8	795.8	683.6	615.5	529.1
ජංගම නොවන වගකීම්	595.7	584.0	415.4	629.1	498.9	427.2	386.1	344.9	310.7	287.7
යෙදවූ ප්‍රාග්ධනය	868.0	867.3	1,036.3	1,195.2	1294.5	1,219.0	1,181.9	1,028.5	926.2	816.8
වත්කම් යෙදවීම										
ස්ථාවර වත්කම්	436.4	397.1	355.3	347.3	89.2	110.8	105.0	116.5	140.9	112.9
දිගුකාලීන ආයෝජන	7.9	7.9	7.9	7.9	7.9	147.6	147.6	17.6	17.6	130.1
කාරක ප්‍රාග්ධනය	423.7	462.4	673.2	840.0	1,197.4	960.6	929.3	764.4	637.7	573.8
	868.0	867.3	1,036.3	1,195.2	1,294.5	1,219.0	1,181.9	1,028.5	926.2	816.8
අනුපාත විශ්ලේෂණය										
ලාභදායිත්වය										
බදු පෙර ලාභය දළ පිරිවැටුමට (%)	0.5	(12.3)	2.85	(12.44)	1.03	0.51	7.12	2.29	6.89	8.76
කොටස්හිමියන්ගේ අරමුදලට බදු පෙර ලාභය(%)	5.2	(127.0)	13.26	(68.10)	4.01	1.89	5.38	7.45	22.81	28.46
කොටස්හිමියන්ගේ අරමුදලට බදු පසු ලාභය (%)	(4.1)	(119.1)	8.84	(41.31)	2.66	1.89	3.11	3.09	13.26	17.69
කොටසක ඉපයීම (රුපියල්)	(3.2)	(96.9)	15.76	(67.13)	6.07	4.29	32.24	6.08	23.45	26.90
ද්‍රවශීලතාවය										
ජංගම වත්කම් ජංගම වගකීම් වලට (අනුපාතය)	1.44 :1	1.46 :1	2.32 :1	2.48 :1	7.15 :1	4.84 :1	4.35 :1	4.08 :1	2.92 :1	3.17 :1
ක්ෂණික වත්කම් ජංගම වතක්මි වලට (අනුපාතය)	0.95 :1	1.04 :1	1.80 :1	1.78 :1	5.56 :1	3.85 :1	3.86 :1	3.12 :1	2.18 :1	2.41 :1
යෝජනාකල ලාභාංශ										
ලාභාංශ (දළ)	-	-	-	-	6.27	6.27	6.27	6.27	6.27	-
කොටසකට ලාභාංශ (රුපියල්)	-	-	-	-	1.80	1.80	1.80	1.80	1.80	-
ලාභාංශ ආවරණය (වාර ගණන)	-	-	-	-	3.37	2.39	17.91	3.37	13.01	-
දිගුකාලීන නුබුන් වත්කම්										
කොටස්හිමි ප්‍රාග්ධනයට ජංගම නොවන වත්කම් %	163	143	58	63	12	33	32	39	47	46
කාරක ප්‍රාග්ධනයට ජංගම නොවන වත්කම් %	105	88	54	42	11	27	27	35	45	42
වර්ෂය අවසානයේ කොටසක ශුද්ධ වත්කම් %	78	81	178	162	228	228	229	196	177	152

වැඩිම කොටස් ප්‍රමාණයක් හිමි කොටස් හිමියන් විසිදෙනා

	2011		2010	
	කොටස් ප්‍රමාණය	%	කොටස් ප්‍රමාණය	%
ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් මහාභාරකාරතුමා	3,050,380	87.56	3,050,380	87.56
ලංකා ඛනිජතෙල් සංස්ථාව	61,206	1.76	61,206	1.76
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	61,206	1.76	61,206	1.76
ලංකා නැව් සංස්ථාව	31,206	0.90	31,206	0.90
පිලිප් සීවලි විජේවර්ධන	20,000	0.57	20,000	0.57
රංජිත් සුජීව විජේවර්ධන	20,000	0.57	20,000	0.57
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	20,000	0.57	20,000	0.57
වී අලෙවි මණ්ඩලය	20,000	0.57	20,000	0.57
රාජ්‍ය චිත්‍රපට සංස්ථාව	20,000	0.57	20,000	0.57
රාජ්‍ය මැණික් සංස්ථාව	20,000	0.57	20,000	0.57
ශ්‍රියන් රංජිත් ගෝමස්	15,821	0.45	15,821	0.45
රුක්මලී ශලනි හුරුල්ලේ	14,822	0.43	14,822	0.43
සී/ස ලංකා වරාය සේවා	10,000	0.29	10,000	0.29
සී/ස සිලෝන් ෂිපින් ලයින්	10,000	0.29	10,000	0.29
කළම්බු ඩොක්යාඩ්	10,000	0.29	10,000	0.29
අශෝක චන්ද්‍රලාල් විජේවර්ධන	7,925	0.23	7,925	0.23
අස්වින් කුමාර් විජේවර්ධන	7,919	0.23	7,919	0.23
කමලිකා ජානකී විජේවර්ධන	6,944	0.20	6,944	0.20
අමිත ලාල් ගුණරත්න	5,967	0.17	5,967	0.17
අර්ජුන් ඉන්ද්‍රජිත් ගුණරත්න	5,967	0.17	5,967	0.17
අයෝමා ඉරන්දතී විජේසුන්දර	5,967	0.17	5,967	0.17

2011 - දෙසැම්බර් 31 දිනට කොටස් හිමිකාරිත්වය

සිට	-	දක්වා	කොටස් හිමියන් සංඛ්‍යාව	කොටස් සංඛ්‍යාව	%
1	-	1,000	58	5,100	0.15
1,001	-	5,000	12	21,903	0.63
5,001	-	10,000	15	102,070	2.93
10,001	-	50,000	9	181,849	5.22
50,001	-	100,000	2	122,412	3.51
100,001	-	500,000	Nil	-	-
500,001	-	1,000,000	Nil	-	-
1,000,000 වැඩි			1	3,050,380	87.56
			97	**3,483,714**	**100.00**

කොටස් හිමියන්ගේ වර්ගීකරණය

	කොටස් හිමියන් සංඛ්‍යාව	කොටස් සංඛ්‍යාව	%
මහාභාරකාරතුමා	1	3,050,380	87.56
පුද්ගලයින්	86	169,716	4.87
ආයතන	10	263,618	7.57

කොටස් හිමියන් ගණන



කොටස් ප්‍රමාණය



ආයතනික තොරතුරු

සමාගමේ නම

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

නීති කෙටුම්පත

සීමාසහිත පොදු සමාගමක් ලෙස 1926 ස්ථාපිත කරන ලදී.
1973 නීති අංක 28 ප්‍රකාර සමාගම් පනත අනුව සහ 2007 සමාගම් පනතේ අංක 07 සහ
1971 අංක 38 දරන මුදල් පනත (ගිණුම් සහ විගණනය සඳහා)

කොටස් ප්‍රාග්ධනය

අනුදත් රු. 50,000,000/-
නිකුත් කළ රු. 34,837,140/-

ලේකම්

කුමුදු එච්. ගුණවර්ධන ඉඹුලමුරේ මහත්මිය

විගණකවරු

විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
කොළඹ 7.

බැංකුකරුවෝ

ලංකා බැංකුව කොළඹ සහ ශාඛා
මහජන බැංකුව කොළඹ සහ ශාඛා
කොමර්ෂල් බැංකුව, සෙලාන් බැංකුව

ලියාපදිංචි කාර්යාලය

35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

ශාඛා කාර්යාලය

දළදා වීදිය, මහනුවර
නව නගරය, අනුරාධපුරය
ශ්‍රී රේවත මාවත, කතරගම, බස් නැවතුම් ගොඩනැගිල්ල, මාතර
කේ.කේ.එස්. පාර, යාපනය.